චලෝ අලුත්නෝ

පේ. ඊ. ගුණසේකර



එලෝ අමුත්තෝ

ජේ. ර්. ගුණසේකරයන්ගේ අනිකුත් කෘති

භාෂාව

* රචනාදර්ශය

විද්‍යා කල්පිත (අනුවාද)

* කුංචනාද
* උභය ජීව
* විස්කම් දූරිය
* අගාධයට ඉහළින්
* මරුට අත වැනූ මැවුම්කරු

අනුවාද

* නව සඳ සහ වෙනත් කතා
  (ප්‍රාග් විප්ලවීය චීන කෙටිකතා)
* කැතී සහ කිඹුලා
  (සෝවියට් ළමා සිනමා කතාවකි)
* අයිය මලෝ
  (යෙංවන සාහිත්‍ය කෘතියකි)

ළමා පොත්

* මුතු මාලය
* ඔටුවාගේ සිහිනය
* කුංචා
* හැංගිමුත්තං

කීර් බුලිංවෙව්ගෙ

එලෝ අමුත්තෝ

Two Tickets to India

සිංහල අනුවාදය

ජේ. ඊ. ගුණසේකර

මිහිර ප්‍රකාශකයෝ
හබරකඩ
හෝමාගම

එලෝ අමුත්තෝ

ජේ. ඒ. ගුණසේකර

ප්‍රථම මුද්‍රණය — 1990

ISBN 955 - 9049 - 01 - 1

©මිතිර ප්‍රකාශකයෝ — 1990

සියලු හිමිකම් ඇවිරිණි.

කැවුකය: ප්‍රේමලාල් පද්මසිරි

මුද්‍රණය: දීපානී

464, හයිලෙවල් පාර

ගංගොඩවිල-නුගේගොඩ

හැඳින්වීම

කීර්තිභාවශේෂෝපගත ජේ. ඊ. ගුණසේකරයන් විසින් සිය ජීවිතයේ අවසන් සමයේ දී සිංහලයට නැඟූ **එලෝ අමුත්තෝ** වූ කලි සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයේ සුප්‍රකට විද්‍යා ප්‍රබන්ධ රචකයකු වූ කීර් බුලිචෙව්ගේ කෘතියකි. *Soviet Literature* සාහිත්‍ය මාසිකයේ විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය අංකයේ *Two Tickets to India* මැයෙන් පළ වූ ඉංගිරිසි පරිවර්තනය ඇසුරෙනි, මේ සිංහල කෘතිය සැකසී ඇත්තේ.

විද්‍යා ප්‍රබන්ධ කථාව (*Science fiction*) වූ කලි විසි වැනි සියවසෙහි වර්ධනය වූ සාහිත්‍යාංගයකි. එහි ප්‍රභවය හා විකාසනය කෙරෙහි විද්‍යාත්මක අන්වේෂණ සහ තදනුබද්ධ අධ්‍යාපනික උන්නතීන් හේතුකාරක වී ඇත. අතීතයෙහි මතු නොව වර්තමානයෙහි ද හුදු කල්පිතයක් – මිථ්‍යාවක් හෝ අනුමානයක් වසයෙන් පවත්නා, එහෙත් යම් නිශ්චිත සාධක යටතේ අනාගතයෙහි සාධනය කර ගත හැකි වෙතැයි නිගමනය කළ හැකි, තථ්‍ය ලෝකයෙන් බාහ්‍ය දෑ විද්‍යාත්මක සාධක සහ නානාවිධ සංසිද්ධි ආශ්‍රයෙන් උත්කර්ෂයෙන් වර්ණනා කොට දැක්වීම විද්‍යා ප්‍රබන්ධ කථාවේ මූලිකාංග යි. මෙය බොහෝ දුරට සමකාලීන විද්‍යාත්මක ඥාන පරාසය තුළට සීමා වේ. විද්‍යා ප්‍රබන්ධ යෙවන සාහිත්‍යයෙහි සුවිශේෂ ස්ථානයක් හිමි කර ගනී.

ජේ. ඊ. ගුණසේකරයන් සිංහල සාහිත්‍යයට දායාද කළ ග්‍රන්ථ සංඛ්‍යාව 13 කි. ඉන් පහක් ම සුපතළ විද්‍යා ප්‍රබන්ධ කෘතීන්ගි සිංහල පරිවර්තන යි. මිනිසාගේ භෞතික පරිසරය කෙරෙහි මතු නොව ඔහුගේ චින්තනය කෙරෙහි ද විද්‍යාව අසීමිත බලයක් පාන අද්‍යතනයේ විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යාංගය මගින් නව ලෝකයේ උරුමකරුවා වන ළමයාට ලොව දෙස අවදියෙන් සහ බුද්ධියෙන් බැලීමට අත්වැලක් සැපයෙනු ඇත. ජේ. ඊ. ගුණසේකරයන් දායක වී ඇත්තේ එම සද් කාර්යයට ය.

ඔවුන්ගේ අනිකුත් විද්‍යා ප්‍රබන්ධ පරිවර්තනවල දී මෙන් ම මෙහි දී ද විද්‍යාවේත් සාහිත්‍යයේත් මනා සංකලනයක් දක්නට ලැබේ. විද්‍යාත්මක සංකල්ප මතුපිටින් බැලූ කල සිත් කා වදින ඒවා නො වුව ද ජේ. ඊ. ඒවා සිංහලයෙන් පවසන්නේ කවියක් කියා පාන පරිද්දෙනි. එහි ලා මුල් කෘතියේ අදහසෙහි ජීවය සුරැකීම ද ඔහුගේ දක්ෂතාවකි.

එලෝ අමුත්තෝ ද ජේ. ඊ. ගුණසේකරයන්ගේ අනිකුත් කෘති මෙන් ම සිංහල යොවුන් පාඨකයන්ට රස ගුලාවක් වනු ඇත. එහෙයින් ම ජේ. ඊ. ගුණසේකර නාමය සිංහල සාහිත්‍යයෙහි සදනුස්මරණීය වනු ඇත.

රත්නසිරි අරංගල

අනුවාදකගෙන්...

එලෝ අමුත්තෝ ළමයින් උදෙසා ලියන ලද පොතකි. එය වඩාත් සුදුසු වන්නේ යොවුන් වියට පිය නහන ළමයින්ට ය.

මේ කතාව ලියන ලද්දේ සෝවියට් දේශයේ ප්‍රවීණ කතුවරයෙකු වන කිර් බුල්වෙව්ගේ විද්‍යා කල්පිත කතාවක් සිංහලට නැඟීමෙනි. වැඩිහිටියන් උදෙසා විද්‍යා කල්පිත කතා සහ ඉතිහාස නවකතා රාශියක් ලියා ඇති ඔහු දෙවරක් ඒ රටේ සාහිත්‍ය සම්මානය ලද විශාරද ලේඛකයෙකි.

විද්‍යා කල්පිත සාහිත්‍යය යනු විද්‍යාව අතින් දියුණු ඇමෙරිකාව, එංගලන්තය, සෝවියට් දේශය, ජපානය වැනි රටවල දියුණු වේ ගෙන යන සාහිත්‍යාංගයකි. විද්‍යාත්මක සහ තාක්ෂණික දියුණුව ඉතා උසස් මට්ටමකට නැඟ ඇත්තා වූ ද එය වේගයෙන් දියුණු වේ ගන යන්නා වූ ද මේ යුගයේ විද්‍යාත්මක අදහස් උදහස් අනුව යමින් නිර්මාණ සාහිත්‍යකරණයෙහි යෙදෙන ලේඛක පරපුරක් ඒ රටවල ඇත. කිර් බුලිවෙව් ඔවුන්ගෙන් එක් අයෙකි.

බුලිවෙව්ගේ විද්‍යා කල්පිත කතා අතර විද්‍යා කල්පිත පසුබිමෙහි ළමා චරිත යොදා ලියන ලද කතා රැසක් ඇත. මේ කතාවල වීරයන් හුරතල් දහකාර – කෙළිලොල් ළමයින් වන අතර ඔවුහු විද්‍යා කල්පිත පසුබිමේ අරුම පුදුම හපන්කම් කරති. එහෙත් ඒවා සියල්ල විද්‍යාත්මක සිතුවිලි ක්‍රමය විසින් මෙහෙයවනු ලබන කල්පිතයෝ ය.

මේ කතා ළමා මනසට ගෝචර වන ලෙසින් ලියන ලද හෙයින් ළමයින්ට ආසාවෙන් කියවිය හැකි ය. ඔවුන් ළමා විය පසු කොට ඇතුළු වෙන්ට තතනන විවෘත ලෝකයේ අදහස් උදහස්වලට ගැළපෙන හෙයින් සහ අනාගතයේ නිසැකයෙන් වැදගත් තැනක් ගන්නා විද්‍යා කල්පිත සාහිත්‍යයට ඇතුළු වීමේ දොරටු විවෘත කරන හෙයින් ඔවුනට ඉතා ප්‍රයෝජනවත් ය.

සියල්ල ජයගත් දැරිය (*The Girl who Conquered Everything*) යන නමින් බුලිවෙව් විසින් ලියන ලද කතාවක් සිංහලට නහා **විස්කම් දැරිය** නමින් අප විසින් පාඨකයන් ඉදිරියේ තබා ඇත. ඇලිස් නම් සුරතල් දහකාර ළදැරියක මෙහි දී සහ අහහරු ලොවෙහි දී දැක්වූ අරුම පුදුම දස්කම්

කීපයක් විස්තර වන එම කතාවට ලැබුණු සතුටුදායක ප්‍රතිචාරය එම කතුවරයාගේ ම තවත් කෘතියක් සිංහලට නහා පළ කිරීමට අප පෙලඹවූ එක් කරුණක් විය.

එලෝ අමුත්තෝ යන නමින් සිංහල කියවන්නන්ට සුදුසු ලෙස අප විසින් සකස් කරන ලද්දේ කිර් බුලිංවව්ගේ **ඉන්දියාවට ටිකට් පත් දෙකක්** (*Two Tickets to India*) නම් කතාව ය. සෝවියට් දේශයේ ළමා පුරෝගාමී කඳවුරක ළමයින් වටා ගොනා ඇති එම කතාවේ විද්‍යා කල්පිත පසුබිම මහ පොළොව ඉක්මවා වෙනත් සක්වළක ග්‍රහ ලෝකයක් කරා ද යයි.

ඉතා පටු සීමාවන් අතර සෙමින් දියුණු වන අපේ යොවුන් සාහිත්‍යයට විවිධත්වය එකතු කිරීමට **එලෝ අමුත්තෝ** පොහොසත් වෙති යි සිතමි.

ජේ. ර්. ගුණසේකර

56, රණාල පාර,
හබරකඩ,
හෝමාගම.

ප්‍රකාශකයන්ගෙන් ...

එක් දහස් නවසිය අසූ අටේ ඔක්තෝබර් අට වැනි දින හදිසියේ අභාව-ප්‍රාප්ත සුප්‍රකට විද්‍යා ප්‍රබන්ධ පරිවර්තක ජේ. ඊ. ගුණසේකරයන් අවසන් වරට ලියූ ළමා කතාව ය, **එලෝ අමුත්තෝ**. ''ප්‍රවීණ සෝවියට් විද්‍යා ලේඛක කීර් බුලිචෙව් විසින් පිට සක්වළත් – සෝවියට් දේශයත් – ඉන්දියාවත් පසුබිම් කොට ලියන ලද **එලෝ අමුත්තෝ** අපූරු ළමා නවකතාව බලා-පොරොත්තු වන්න'' යනුවෙන් මීට පෙරාතු ව ලියා මුද්‍රණයට භාර දී තිබී අප විසින් එළි දක්වන ලද **මරුට අත වැනූ මැවුම්කරු** කෘතියේ දී කතුවරයා විසින් ම සඳහන් කරනු ලැබ ඇත. කතුවරයාගේ එම ප්‍රකාශය ඉටු කිරීම අරභයා මිය යාමට පෙර අත්පිටපත සකස් කර තිබුණු මෙම ළමා විද්‍යා කල්පිත ප්‍රබන්ධය ප්‍රකාශයට පත් කිරීමට අපි පෙලඹුණෙමු. කතුවරයා අද ජීවතුන් අතර නැති හෙයින් ඔහුගේ කෘති ඇසුරෙන් පාඨකයන් ලත් ආස්වාදය ඉදිරියට ගෙන යාම මේ කෘතියෙන් සමාප්ත වන නිසා මෙහි අගය තව ද වැඩි වනු නො අනුමාන ය. ග්‍රන්ථ මැනැවින් සකසා එළි දක්වීමේ පළපුරුද්ද කතුවරයාට පමණට ම අප කෙරෙහි නොමැති බැවින්ද ඔහුගේ අනික් කෘතීන් හා සසඳන කල මෙහි යම් යම් අඩුපාඩු තිබිය හැකි වුව ද එය පාඨක රුචියට බාධාවක් නො වෙතැයි සලකමු.

මෙහි අත්පිටපත ශෝධ්‍ය කළ තරුණ ලේඛක රත්නරිසි අරංගලයන්ට අපට අවශ්‍ය උපදෙස් ලබා දුන් ජනතා ලේඛක පෙරමුණේ ලේකම් ගුණසේන විතාන සූරීන්ට ද පිට කවරය සරසා දුන් ශිල්පී ප්‍රේමලාල් පද්මසිරිට ද, **එලෝ අමුත්තෝ** මනහර වත් ඉක්මනින්ම මුද්‍රණය කර දුන් නුගේගොඩ 'දීපානී' මුද්‍රණ ආයතනයට ද අපේ ස්තුතිය පිරිනමමු.

මිහිර ප්‍රකාශකයෝ
හබරකඩ – හෝමාගම.

ජේ. ඊ. ගුණසේකරයන්ගේ
සහභාගිත්වයෙන් බිහි වූ

ජනතා ලේඛක පෙරමුණට
මේ කෘතිය පිරිනමමු

— මිහිර ප්‍රකාශකයෝ

01

පිඹුරා රූ පානේ ඇදී යයි

යෝවුන් පුරෝගාමීන්ගේ කඳවුර මාරු වීමට ඇත්තේ තව දවස් හතරකි. අඟුහ සිදුවීමක් නැති ව මාසය ගෙවී ගියාක් මෙන් මේ ටික දවස ද අමුත්තක් නැති ව ගෙවී යතැයි කවුරුත් සිතූහ. එහෙත් කඳවුරේ කිසියම් දෙයක් සිදු විය.

දහවල් ආහාරයෙන් ටික වේලාවකට පසු දෙවන කණ්ඩායමට අයත් යුරා සෙමියනොව් සහ කවුරුත් ''රෝසි'' නමින් හඳුන්වන ඔලෙග් රෝසොව් නමැති පිරිමි ළමයි දෙදෙනා එක් ව කුස්සිය පිටුපස ඇති එළිමහන් බිමේ දී ''ලාරිස්කා'' නමැති බැළලිය අල්ලා ඇගේ වලිගයේ ඇණ කැබලි පිරවූ බෙලෙක්කයක් එල්ලීමට වෑයම් කළහ. ඔවුන් අදහස් කෙළේ බැළලිය ගායක කණ්ඩායම පුහුණු වන වේදිකාවට දැමීමට ය. මෙය රෝසිගේ අදහසකි. එහෙත් එම අශෝභන කටයුත්ත ක්‍රියාවෙහි යොදවන ලද්දේ යුරා විසිනි.

එහෙත් බැළලියගේ විලාපය ඇසූ තුන් වන කණ්ඩායමේ ගැහැනු ළමයකු වන යූලියා ග්‍රිබ්කෝවා, පදුරු අතරින් පැන ගෙන අවුත් කිසි ම අනතුරු ඇඟවීමක් නැති ව ජෙරල්ඩ් ඩුරල්ගේ ''සතුන්ට ආදරය කිරීම'' නම් පොතෙන් යුරාගේ කම්මුලට පහර දෙන්නට වූවා ය. තමාට පහර දෙන තැනැත්තිය හැඳින ගත් යුරා ද නිකම් නො සිටීමට ඉටා ගත්තේ ය. ඔහු අත මිට මොළවා යූලියාගේ නාසයෙන් ලේ වැගිරෙන කුරු ඇගේ මූණට පහර දුන්නේ ය. පොතෙන් පහර දී බැරි තැන ඈ ඔහුගේ දකුණු කම්මුල සිරුවා ය. මුල දී රෝසි බලා සිටියා පමණි. එහෙත් සණ්ඩුව බෙරන්නට යාමෙන් ඔහුටත් ගුටි කන්නට සිදු විය.

එදින සවස යූලියා තමාගේ පංති සගයා සහ මිතුරා වූ fපීමා කොරලොව් සමඟ එම එළිමහනේ ම කතා කරමින් සිටියා ය. යූලියාට කෑම කන්න වත් ආසාවක් තිබුණේ නැත. කඳවුරේ සිනමා දර්ශනයට පසු ව කණ්ඩායම්

නායකයන් අධ්‍යක්ෂකගේ කාමරයට රැස් ව තමා කඳවුරෙන් නෙරපා දැමීමේ තීරණය ගන්නා තෙක් ඈ බලා සිටියා ය. කිසියම් හේතුවක් නිසා යුලියා දෙස බැලීමට කාටත් අවශ්‍ය විය. ගැහැනු ළමයි යුරාටත් රෝසිටත් දෙස් නැහූ අතර පිරිමි ළමයි සිනා සුණාහ.

"ඔයාට ආත්තම්මගෙන් විසුමක් හම්බ වෙන එකක් නෑ. එයා හරි වසයි නෙ" fපිමා කීවේ ය. යුලියා කිසිත් නොකිවා ය.

"ඔයා අපේ ගෙදර හැංගෙන්න" fපිමා කීවේ ය. "අපේ ගෙදර උදව්ය නිවාඩුවට ගිහිල්ලා. ඒ ගොල්ලොම ආපහු ආවොත් අපි ඔයාව අපේ පංතියෙ වෙන කෙනෙකුගේ ගෙදරට යවනවා. ඒත් ඇයි ඔයා එහෙම දෙයක් කළේ ? විහිළුවෙන් පූසාට රිදෙන්නෙ නෑ."

"උගෙ හැඟීම ගැන කොහොම ද ? ඌට සිදු වුණු අවමානය ? ඔයා දන්නවා නෙ බළලුන්ගේ ස්නායු සෛල ප්‍රකෘතිමත් වෙන්නෙ නැති බව."

"බළලුන්ට ස්නායු තියෙනවා ද ?" fපිමා පුදුමයෙන් ඇසුවේ ය.

"සතුන්ට කතා කරන්න බැරි හන්ද උන්ට අයුතු විදිහට සලකන එක කොහොමටත් හරි ද ?"

"ඔයා පුදුම ළමයෙක්, යුලියා" fපිමා කීවේ ය. "වෙලාවකට මට හිතෙනව ඔයා කොයි තරම් නපුරු සතෙකුට වුණත් ආදරය කරාවි කියා. ඔයා කොටියෙකුට වුණත්, ගෝනස්සෙකුට වුණත් නවාතැන් දේවි."

"නරක සතුන් කියල ජාතියක් නෑ. හරියට නරක අත දරුවන් නැතුව වගේ. පස්සෙ ලොකු වෙන කොට තමයි මිනිස්සු වෙනස් වෙන්නෙ. මුල දී කවුරුත් හොඳ යි."

යුලියාට fපිමා සමඟ කතා කිරීමට අවශ්‍ය නොවී ය. ඔහු ඉවත් ව යෑතොත් හොඳ යැයි ඈ සිතුවා ය. ඇගේ තත්ත්වය ඇත්තෙන් ම දුෂ්කර එකක් විය. අම්මා සහ නාත්තා නිවාඩුවකට ගෙදර ගිහින් ය. ආත්තම්මාට ඇවිදින්නත් අමාරු ය. ඉතින් යුලියා ගෙදර ගිය විට "මොකද නුඹ කලින් ආවෙ ?" කියා ඔවුන් අසනු ඇත. "සණ්ඩු වෙලා මාව දෙට්ට දැම්මා" කියා ඈ පිළිතුරු දෙනු ඇත.

"සර්පයන්ට, ගෝනුස්සන්ට, බළලුන්ට, නපුරු සතුන්ට මං කැමති නැහැ" fපිමා කල්පනාකාරී ව කීවේ ය. "මම නගරයෙන් ආපු කෙනෙක්. මම වඩා කැමති යි බස්වලට."

මෙසේ කියමින් ඔහු හිස ඔසවා අහස දෙස බැලුවේ ය. වැට ළඟ තිබෙන ලොකු ගහේ කොළ අතර විශාල කේබලයක් මෙන් කඳ වඩා එතුණු මහත දුඹුරු පාට කිසිවක් ඔහු දුටුවේ ය. කේබලය අග, කළු පාට ඇස් නෙරවා fපිමා දෙස බලා සිටින හිසක් ද විය.

"ඔඩි" කියමින් අමාරුවෙන් කට ඇර හුස්ම ගත් fපිමා බියෙන් සැලෙමින් ගහ දෙසට ඉහි කෙළේ ය. 'සර සර' හඬක් ඇසුණේ ය. අළු පාට ලොකු කේබලය අතුරුදන් විය.

"මට මුකුත් පේන්නෙ නෑ" යුලියා කීවා ය.

"මට පේන්නෙත් නැහැ" fපිමා කීවේ ය. "ඔයාගෙ කන්දර අහලා මටත් හොල්මන් පේනවා."

සැන්දෑ වේගත එයි. පළමු ව එන මදුරුවන් ඉව අල්ලමින් කර කැවෙන්නාක් මෙන් පෙනේ. ග්‍රීෂ්ම සෘතුව අවසන් වන බව අහවමින් කැළෑව දෙසින් හතු සුවඳ හමයි. අඩි පාර දිගේ ලාරිස්කා බැළලිය ආවේ සමහර විට යූලියාට ස්තුති කරන්නට විය හැකි ය. එහෙත් එතැනට එන්ට කලින් හිටිහැටියේ ම පිට කොන්ද නවා මයිල් පුප්පා පදුරු දෙස බැලූ ඈ පිඹින්නට වූවා ය. අනතුරු ව ඈ ආපසු හැරී පැන දිව්වා ය.

"අතන මොකෙක් හරි ඉන්නවා." fපිමා කීවේ ය. "බළල්ලුන්ට ඉව තියෙනවා."

"මං ගිහින් බලන්නම්." යුලියා කීවා ය. "මෙතන ඉඳ ගෙන බලා ඉන්න එකේ තේරුම මොකක් ද ?"

වැට ළඟ පදුරු අස්සේ විශාල අද්භූත දෙයක් සැඟවී ඇතැයි යන හැඟීමක් යුලියා තුළ ද ඇති විය. වැට සන බිත්තියකින් මෙන් පදුරු ගොන්නෙන් වැසී තිබිණි. එහෙත් කෙනෙකුට ගඟ පැත්තට රිංගා යා හැකි තරමේ කපොල්ලක් වැවේ තිබෙන බව කණ්ඩායම්වල නායකයන් වත් දැන සිටියේ නැත.

යුලියා අඩි දෙකක් පමණ ළං වූ විට පදුරු සෙලවී යළි නිහඬ විය.

පසු පස සිට කතා කරන අයගේ කට හඬ ඇසෙන්නට විය. චිත්‍රපටිය අවසන් වී ඇත. චිත්‍රපටිය නරඹා ආපසු එන ළමයින් තමා ගැන කරන විහිළු තහළු යූලියා මහත් ධෛර්යයෙන් ඉවසා ගෙන සිටියා ය. කණ්ඩායම් නායකයෝ හා වැඩිහිටියෝ කෝලාහලය ගැන සාකච්ඡා කිරීම පිණිස අධ්‍යක්ෂකගේ නිවසට යමින් සිටියහ.

තමා නතර වී සිටින කාමරයට යාමට පෙර යුලියා මඳක් නතර වී බලා සිටියා ය. කාමරයට යන ඈ තමාගේ දෛවය ගැන ගන්නා තීරණය බලාපොරොත්තු ව ඇගේ ඇඳ උඩ හිඳ සිටිනවා ඇත.

තමා කොතෙක් වේලා ඇඳ උඩ හිඳ සිටියා දැයි ඈට තේරුමක් නැත. අඳුර දැඩි විය. නාට්‍ය මණ්ඩපය දෙසින් සංගීතය ඇසෙන්නට විය. ඩුරල්ගේ පොත කියවීමට යුලියා තැත් කළත් එය නො කළ හැකි බව ඈට වැටහිණ. ඇට විදුලි පහන දල්වන්නට වත් ඕනෑකමක් නො වී ය.

කවුළුවට ළඟා වන කිසිවෙකුගේ අඩි ශබ්දයක් ඇසිණි. නො අනුමාන ව ම ඒ fපිමා විය යුතු යැයි යුලියා සිතුවා ය.

"යුලියා, ඒ ගොල්ලො සාකච්ඡා කරනවා." fපිමා කීවේ ය.

"මා ගැන ද ?"

"ඔව්, මම ජනේලය යට ඉඳන් ඇහුම් කන් දුන්නා. ඒක විවෘත සාකච්ඡාවක්, මට සේරම ඇහුණා."

"ඉතින් ?" යුලියා කතා කිරීමට තැත් කළා ය. ඇගේ කට හඬේ බියක් හෝ චකිතයක් හෝ නො තිබිණ.

"ඔක්කොම හිනා වුණා."

"ඇයි ?"

"ඒ ගොල්ල මේක බුද්ධිමත් විදිහට විසඳන්න ලෑස්ති වුණා. ඒත් පස්සෙ ඔක්කොම හිනා වෙන්න පටන් ගත්තා. ඇයි ? ශාරීරික අධ්‍යාපන උපදේශක ස්ටෙපානිච් ඉල්ලා සිටියා, සාක්කියට බළලා කැඳවන්න කියලා, ඔයාට තේරුණා ද ?"

"මට මොනවත් තේරෙන්නෙ නෑ."

"ඒ ගොල්ලො තීරණය කළා ඔයාට වත් සෙමියනොව්ට වත් දඬුවම් නො කරන්නට. අපේ කණ්ඩායම් නායක රිටා, සෙමියනොව්ට තදින් පහර දෙමින් කතා කළා. සෙමියනොව් මාත් එක්ක ජනේලය යට හිටියා. තමා සියලු දේ ම කළේ ආත්මාරක්ෂාවට බවත් ඔයා හරියට වල් බැළලියක් වැනි බවත් සෙමියනොව් කෑ ගැහුවා."

"මට ඉඩ දුන්නොත් මම එයාට උගන්නනවා..." යුලියා පටන් ගත්තා ය.

"ඒත් ආයිත් පාරක් නම් ඔයාට ඉඩ දෙන එකක් නෑ."

නැටුම් ශාලාවේ සිට ආ ගැහැනු ළමයි කීප දෙනෙක් හරියට පිරිමි ළමයින් මෙන් නො වැදගත් දේ ගැන උස්හඬින් කතා කරන්නට වූහ. fපිමා තමා යුලියාගේ කුටියේ සිටින බව අනෙක් ළමයින්ගේ ඇසට ලක් වනුවට බියෙන් මෙන් මහ හැර ගියේ ය. යුලියා නිදන්නාක් මෙන් අහවා ඇදෙහි වැතිර සිටියා ය.

ඈ ඇත්ත වශයෙන් නිදා සිටියේ නැත. ඇට නිදා ගන්නට ඕනෑකමක් තිබුණේත් නැත. තාවකාලික කුටිවල නිදන්නෝ එකිනෙකා නිහඬ වූහ. අන්තිමේ දී ඈ හැර මුළු කඳවුර ම නිදන්නට විය. කඳවුරට ආලෝකය පැතිරීමට හඳ පායා ආවේ ය. මදුරුවෙක් සංගීතය පතුරන්නට වී ය. ඈත නදියේ නැවක සයිරනය නාද කෙරිණ.

"යුලියා" යි ජනේලය පැත්තෙන් සිහින් හඬක් ආවේ ය. එය හරියට මදුරුවකුගේ සංගීතය වැනි විය.

යුලියා නැගිට ඇඳ මත වාඩි වූවා ය. වාසනාවකට මෙන් ඇඳ තිබුණේ ජනේලය අද්දර ය. ඈ හඬ එන දෙසට කන් යොමු කළා ය. එහි කිසිවක් නැත. පාරවල් සුදෝ සුදු සඳ එළියෙන් පැහැපත් වී තිබිණ. බිඳී ගිය වලා කැටි අහසේ සෙමෙන් පා විය. හැම තැන ම වූයේ කාන්තාරයක නිහඬියාව ය.

"කවුද ?" ඈ ඇසුවා ය.

"බය වෙන්න එපා, යුලියා." හරස් පාරවල වැඩුණ ලොකු රෝස පඳුර දෙසින් සිහින් හඬක් ආවේ ය. "මේක විහිළුවක් නොවෙයි. අපට ඔයාව හමු වෙන්න ඕනෑ. ඒත් කාට වත් නොපෙනී."

"ඉතින් ඔයා මට පේන්න එන්නකෝ" යුලියා කීවා ය. "ඔයා කවුද ?"

"ඔයා බය වෙයි" හඬ කී ය.

"දැන් මාව බය කරන්න කිසි දේකට බෑ" යුලියා කීවා ය. "මට බය මාව කඳවුරෙන් පිටමං කරාවි කියල විතරයි."

"ඔයාට ස්තුතියි. මට කරන්න තියෙන්නේ මාව එළිදරව් කරන එක විතරයි. හිතේ ධෛර්යය උපදවා ගන්න. ක්ලාන්ත නොවී ඉන්න උත්සාහ කරන්න."

යුලියා කවද වත් කුමකට වත් බයේ ක්ලාන්ත වී නැත. එහෙත් මෙවැනි අනතුරු ඇඟවීමක් කවුරු වුවත් බිය පත් කරනසුලු ය. මෙය නපුරු සෙමියනොව්ගේ පළි ගැනීමක් වත් දැයි ඇට සිතිණි.

එවිට ම පඳුර පැද්දුණේ ය. එයින් දිග ලොකු රබර් නළයක් දහරය ලිහමින් රිදීවන් අඩි පාර දිගේ ඇදී ගොස් තුන් වන කණ්ඩායමේ කුටිය වෙනට ළඟා විය. යුලියාගේ සිතට මඳ සහනයක් දැනුණේ ය. අඩු ගණනේ ඒ නපුරු සෙමියනොව් නොවීම වුවත් ඇගේ සිතට සහනයකි.

අඩි පාරේ, මීටර් පහක් තරම් දිග, යුලියාගේ කකුල තරම් මහත පිඹුරෙක් දිග ඇදී උන්නේ ය. උගේ බෙල්ල පටු ය. හිස පළල් ය. පැනලි ය. දෙකට බෙදුණ දිව වරින් වර කටින් පිට වී ඇතුළට ඇදුණේ ය; ඌ සිය නිසල ඇස් ඔරවා ඈ වශී කරන්නට මෙන් යුලියා දෙස බලා හෙන සිටියේ ය. ඌ අඩි පාර දිගේ මීටර් කීපයක් ඇදී ගොස් ජනේලය යට දරණ ලා ගත්තේ ය.

"හද් – දෙයියනේ !" යුලියා තදින් හුස්ම ඉහළට ඇද්ද ය. සත්ත්ව විද්‍යාව ගැන තරමක දැනීමක් ඇති ඈ ජාලාකාර (= දැලක් බඳු) වයිරම සහිත සර්ම කලාපීය රටවල වෙසෙන ජීවියා – පිඹුරා – හඳ එළියෙන් අඳුනා ගත්තා ය. මේ රටේ පිඹුරන් නැති නිසා සර්පයෙකුට කතා කරන්නට හැකි වීම ඇගේ විස්මයට හේතුවක් නොවී ය.

"ඔව්, මම දන්නවා" දැවැන්ත සර්පයා ඇගේ සිතුවිල්ලට එකඟ බව පළ කෙළේ ය. "මේක වෙන්න බැරි දෙයක් තමයි. අපි මේ රටේ දකින්න ලැබෙන්නෙ නෑ."

වචන පිට කරන විට සර්පයාගේ කට ඇරුණ නමුත් එය උගේ කතා කිරීමක් නොව ඇතුලේ ඇති යන්ත්‍රයක ශබ්දය පිට වීමක් මෙන් ඇසුණේ ය.

"ඔයාට එන්න පුළුවන් කොච්චර වෙලාවකින් ද ?" සිහින් හඬක් යුලියාගේ පිටුපසින් ඇසුණේ ය.

ඈ වහා නැගිට ජනෙල් පඩිය උඩින් පැන්නා ය.

"අපි කොහාට යන්න ද ?" ඈ රහසින් මෙන් ඇසුවා ය.

"කුස්සිය පිටිපස්සෙ වන ලැහැබට" පිඹුරා පිළිතුරු දුන්නේ ය.

"එහෙනං අපි යමු. හැබැයි බල්ලෙක් හරි මුරකාරයෙක් හරි ඕනෑ ම වෙලාවක එන්න පුළුවනි."

ඈ ඇඟිලි තුඩු බිම ඔබමින් අඩි පාර දිගේ දිව්වාය. ඈ පසු පස ඇදී යන පිඹුරා සිහින් හඬින් ඈ ඇමතුවේ ය.

"ඔයාට බයක් ඇත්තෙම නැද්ද ?"

යුලියා එළිමහනට දිව්වා ය. එය පුදුමයක් නමුත් ඈ බය වුණේ නැත. නපුරු සෙම්යනොවිට වඩා කතා කරන පිඹුරෙක් හොඳ ය.

කිට්ටුව බල්ලෙක් බිරුවේ ය. ඒ මුරකාරයාගේ බල්ලා විය යුතු ය. වේගය වැඩි කර ඇදී ගිය පිඹුරා ලැහැබ තුළ නොපෙනී ගියේ ය.

"මෙහෙන් එන්න" හඬ කීවේ ය. "මා පස්සෙන් එන්න, නිර්භීත දරුවා."

නිර්භීත දරුවා වන ලැහැබ පසු කර ගියේ ය. ඉදිරියෙන් වැටෙ කපොල්ල විය. එතැන සිට කැළෑව ය. කැළෑව අඳුරු ය ; තෙත ය. තමාගේ තුවාල හොඳින් වේළී ඇද්දැයි යුලියාට සිතුණේ ය.

දැන් සර්පයා අතුරුදන් වෙලා ය. "ඔයා කොහෙද ?" යුලියා ඇසුවා ය. පිළිතුරක් නැත. "එයයි මට එන්න කීවේ" ඈ කීවා ය. ඇගේ සිතට බියක් දැනිණි.

නිදි ගත් කැළෑව සොහොනක් මෙන් නිසල ය ; නිහඬ ය. ඇගේ දකුණු පසින් අනතුරු අහවන කෙඳිරිල්ලක් සහ අසෙකුගේ කුර ගැටීමක් බඳු හඬක් ඇසුණේ ය. ඊට පසු සුපුරුදු පිඹුරු හඬ කාට දෝ කතා කෙළේ ය.

"රුසියන් බසින් කතා කරන්න. මිනිසුන් බිය ගන්වන්න එපා."

"ඔබ හොඳින් පරීක්ෂා කළා ද ?" දෙවන හඬක් ඇසි ය. "ඒක උගුලක් වෙන්න බැරි ද ?"

"මොන විකාර කතාවක් ද ?" පිඹුරා එයට විරුද්ධ විය. "අපි විශ්වාස නො කළ හැකි තරම් වාසනාවන්ත යි."

"මට නම් සහතික නෑ. වාසනාව ගැනත් මිනිසුන් ගැනත් විශ්වාස කිරීම මම දැන් නතර කරලා" දෙවන හඬ පිළිතුරු දුන්නේ ය.

"දෙය්යන්නෙ නාමෙට ඔයා කොහෙද ?" යුලියා ඇසී ය. "මම සිතලේ ගැහෙනවා. ඔයාලට පුළුවන් විවාද කරන්න විතරයි."

"පොඩ්ඩක් දකුණට යන්න. මදක් එළිමහන පැත්තට – මට ඕනෑ ඔයා මගේ යාළුවාට අඳුන්වා දෙන්න." යුලියා මදක් දකුණට ගියා ය. එළිමහන් තැනක් හමු විය. එහි මැද ඔළුවේ විශාල බැන්ඩේජයක් බඳින ලද කොටියෙක් සිටියේ ය.

02

අනතුරකට ගොදුරු වූවෝ

''වෙලා තියෙන කරදර මදිවට තව එනක්'' කොටියා දුටු යුලියා කීවා ය. ඈ කොටියා දෙසට හැරී මෙසේ ද කීවා ය : ''කවුරු හරි ඔයාව දැක්කොත් බය වෙලා මැරේවි.''

''මට වුණේ ඒකෙ අනික් පැත්ත'' කොටියා දුක් මුසු ලෙස කීවේ ය. ඔහු වචන පිට කෙළේ අමාරුවෙනි. ඔහු ඒවා උච්චාරණය කළ ආකාරය නිසා කියන දේ තේරුම් ගන්නත් අමාරු විය.

''යුලියා වාඩි වෙන්න'' පිඹුරා කී ය.

වට පිට බැල්ල ඇට පිඹුරා උස රවුම් මෙට්ටයක් සෑදෙන ලෙස දරණ ගසා ගෙන සිටින බව පෙනිණි.

''එන්න, වාඩි වෙන්න. ලජ්ජ වෙන්න එපා'' පිඹුරා කීවේ ය. ''බීම තෙත යි. ඔයාට වාඩි වෙන්න වෙන තැනක් නෑ.''

යුලියා ස්ප්‍රිං මෙට්ටයක් වැනි සුව පහසු දනවන පිඹුරු දරණය මත වාඩි වූවා ය. පිඹුරාගේ හිස ඇගේ කන ළඟින් එහාට මෙහාට පැද්දුණේ ය. ඈ කොටියා දෙස බැලුවා ය. ඔහු සිය ඉදිරි ගාත් මත හිස තබා ගෙන අමනාපයෙන් මෙන් ඈ දෙස බලා ගෙන සිටියේ ය.

''මට සමා වන්න'' දූරිය කොටියාට කීවා ය. ''මට සමා වන්න, ඔයා බෙංගාලි ව්‍යාඝ්‍රයෙක් ද ? එහෙම නැත් නම් උසුරි කොටියෙක් ද? මහතත් පෙනුමත් බෙංගාලියෙකුගෙ වගෙයි. ඒත් මේ හරියෙ හොඳට එළිය නෑ නොවැ.''

''මම පිඬාවට පත් කරනු ලැබූ බළලෙක් විතරයි'' කොටියා දුක් බර ලෙස කීවේ ය.

"සහතික ඇත්ත" පිඹුරා එය අනුමත කෙළේ ය. "ඒත් අපේ පුංචි මුත්තා කැමති ඇති අප ගැන වැඩිපුර යමක් දැන ගන්න. එහෙම නේ ද?"

"ඔව්, ඔව්. මට දැන ගන්න ම ඕනෑ" යුලියා කීවා ය.

"කොටින් ම අපි අනතුරකට භාජන වූ බවත් අපට උදව් ඕනෑ කරන බවත් කිව යුතු යි."

"ඔයාල සත්ත්වෝද්‍යානයක ඉඳල නැති වුණා ද ?"

"නැහැ, නැහැ. ජීවිතය හැම විට ම වගේ විස්මය ජනක යි. අපි පොළොවට ගොඩ බැස්සෙ මේ පෙරෙයිද" යුලියා දෙස බැලීමට හිස ඇළ කරමින් පිඹුරා කීවේ ය.

"ගොඩ බැස්සා ?" කොටියා ඇස් පියා ගෙන ම ඇසුවේ ය. "ගොඩ බැස්සා නෙමෙයි, කඩා ගෙන වැටුණා. දඬිබඩාස් ! කරකරාස් ...!"

"ඉගේ මිත්‍රයාට ඔයාලගෙ භාෂාවේ වචන තාම හරියට පුරුදු නෑ එයාගෙ ඔළුවත් තඩිස්සි වෙලා - බැන්ඩේජයකුත් දලා."

"එහෙම නම් ඔයාල පිට සක්වළ ඉඳල ආපු කට්ටියක් ද ?" යුලියා පුදුමයෙන් ඇසුවා ය. "එහෙ ඕක්කොම ඔය වගේ ද ?"

"කවුද ඔක්කොම ?"

"ඔයාලගේ ග්‍රහ ලෝකෙ ඉන්න අය ?"

"අනේ නෑ. අපව එව්වෙ කාගෙ වත් විශේෂ අවධානයට භාජන නොවෙන විධියට අපේ හැඩ රුව වෙනස් කරලයි. මේ අපේ හැබෑ ස්වරූප නෙමෙයි "

"මොනවා ? අවධානයට භාජන නොවන්නට ? ඔය ස්වරූපය තමයි කාගෙත් අවධානයට ලක් වෙන්න හොඳ ම විධිය. එව්වරත් නෙමෙයි, කවුරුත් බයින් තැති ගන්වන්නටත්."

"හරි තමයි" හිස ඔසවා තමාගේ බියකරු දළ පෙනෙන සේ කට අයා ඇනුම් ඇරි කොටියා කීවේ ය.

"ඒත් අපි පියාසර කෙළේ මෙහාට නෙමෙයි නෙ. අපි ආවේ අපේ ස්වරූපය නිසා කිසි ම සැකයක් පැන නොනගින තැනකට. දකුණු ඉන්දියාවේ මයිසෝර් රාජ්‍යයේ සර්ම කලාපික මහ වනාන්තරයකට. අපි මෙහාට පාත් වුණේ අහම්බෙන්. අපි ආපු යානය අනතුරකට භාජන වුණා."

"ඉතින් එහාට යන්න බැරි වුණා ?"

"ඔව්, අපේ වැනි හොඳින් සංවර්ධනය වුණු ශිෂ්ටාචාරයක වුවත් වැරදී ඇති වෙන්න පුළුවන්" පිඹුරා පසුතැවිල්ලෙන් කීවේ ය. "අපි මේ ගමනට විශේෂයෙන් පුහුණු කරනු ලැබුවා අපි දකුණු ඉන්දියාවේ සුවිශේෂ තත්ත්වයන් හොඳින් ප්‍රගුණ කළා. අපේ ශරීර එහි වනගත පරිසරයට ඔබින පරිදි නැවත ගොඩ නහා ගන්නට අවුරුදු තුනක් ගත වුණා. එක අතකින් එහාට හොඳ හැටි ගැළපෙන්නට – අනික් අතින් අහම්බෙන් සිදු විය හැකි මොන අන්දමේ පහර දීමකින් වුවත් ආරක්ෂා විය හැකි තරම් ශක්තිමත් වන්නටත් අපට ඕනෑ කළා. අපි මේ වේශයන් තෝරා ගත්තෙ ඒ නියයි."

"ඒත් ඔවුන්ට ඔබ දෙන්නට ඉන්දියානුවෝ දෙන්නෙකුගෙ ස්වරූපය දෙන්න නිබුණ නෙව. එතකොට කිසි ප්‍රශ්නයක් ඇති වෙන්නෙ නෑ. අපට කියන්න නිබුණා විශ්වවිද්‍යාලයෙ ඉගෙන ගන්න ආපු අය බව."

"මිනිස්සු !" කොටියා කෙළ ගැසුවේ ය. "එතකොට කොහොම ද ලිය කියවිලි ගැන ? පාස්පෝට්, වීසා එහෙම – ප්‍රශ්නා කිරීම් ? රජයේ රක්ෂිත වන බිමට ඇතුළු වීමේ අවසර පත්‍ර ?"

"ඔව්, ඇත්තෙන් ම රක්ෂිත වනයකට ඇතුළු වීමේ දී මිනිහෙක් වෙනවාට වඩා කොටියෙක් වෙන එක බොහොම පහසුයි" පිඹුරා කී ය. "කොහොමටත් අපි අපට පැවරුණ කටයුත්ත ඉටු කරන්න ඕනෑ. මායයක් තුළ දී අප කැටුව යන්නට අභ්‍යවකාශ යානයක් ඒවි. දැනට ඒක නවත්වා තිබෙනවා... ග්‍රහ ලෝක. මොකද්ද ඒකෙ නම ?"

"ප්ලැටෝ" කොටියා ටිකක් තදින් කී ය. "ඔබට කී පාරක් කියන්න ඕන ද ?"

"ප්ලැටෝවලට එහා !" යුලියා කීවා ය. "එහෙනං ඕ ගොල්ලො මායයක් හැංගිලා ඉන්න ඕනෑ ?"

"අපිට ඉන්දියාවට යන්න ඕන. අර වනාන්තරයට. ඔයාට තේරෙන්නෙ නැද්ද ?"

"ඔයාටයි තේරෙන්නෙ නැත්තෙ ? ඔයා හිතන්නෙ මම කී දවයක් පිඹුරු දරුණයක වාඩි වෙලා කොටියෙක් එක්ක කතා කර කර ඉඳල තියනවයි කියල ද ?"

"තරහ වෙන්න එපා, හොඳ ළමයා" පිඹුරා කීවේ ය. "මගේ මිත්‍රයා තේරුම් ගන්න උත්සාහ කරන්න. ඊයේ එයා උදව් ඉල්ලා හුදෙකලා ගේකට ගියා. ඒකෙ හිටපු ගෑනියෙක් පෝකරයකින් (= ගිනි අවුස්සන යකඩ කුරකින්) හියට පහර දීලා. ඔයා දන්නව ද ? එහෙම ආයුධයක් ?"

"අනේ බොහොම කනගාටුයි" යුලියා කීවා ය. "ආයුධය ගැන මට තේරුමක් නෑ. ගෑනි හොඳට ම බය වෙන්න ඇති."

"අපේ ප්‍රශ්නය දැන් ඔයාට තේරෙනවි ඇති" පිඹුරා යළි කී ය. "අපේ කැප්සූලය විනාශ වුණා. අපි බේරුණේ හාස්කමකින්. යානය අප ගෙන යන්න තව මාසෙකින් එනවා ඒත් මෙහාට නොමෙයි සම්පූර්ණයෙන් අමුතු රටකට. අපි මිනිසුන්ට පේන්න යන්න බයයි. මයිසෝර් වනාන්තරයේ අපේ කටයුත්ත ඉටු කරන්නත් ඕනෑ."

"මොන කටයුත්ත ද ?" යුලියා ඇසුවා ය.

"අවුරුදු සියකට පමණ උඩ දී අපට ඉතා කිට්ටු තාරකා පද්ධතියේ තාරකා මණ්ඩලීය ප්‍රදර්ශනයත් සඳහා අපේ අගනා ජාතික වස්තු රාශියක් ගෙන යමින් සිටි අභ්‍යවකාශ යානයක් විනාශ වී ඇද වැටුණා. අවුරුදු සියකට කිට්ටු කාලයක් තිස්සේ අපේ විද්‍යාඥයෝ යානය ගමන් ගත් මාර්ගය පිළිබඳ ව සොයා බැලුවා. විනාශයෙන් ඉතිරි වූ දේ මයිසෝරයේ රාජ්‍ය රක්ෂිත වනයේ තිබෙන බව ඔවුන් නියත ලෙස දැන ගත්තේ මීට අවුරුදු පහකට උඩ දී යි අප එව්වේ ඒ වස්තු ගැන සොයා බලන්නට. ඉතින් අපි අපට පැවරුණ කටයුත්ත ඉටු නො කළොත් අපේ රට වැසියන් දහස් ගණනකගේ බලාපොරොත්තුත් උත්සාහයත් සුළඟේ යාවි" හෙමින් හුස්මක් හෙළූ පිඹුරා උගේ හිස පාත් කෙළේ ය.

"මට බය අපට මේ ගැන උදව් කරන්න බැරි වෙවි ද කියලයි" යුලියා කීවා ය. "ඉන්දියාව හරි ඇත යි. ඒත් එහි යන්නා කොටින්ට ටිකට් විකුණන්නෙ නෑ."

"මම කිව්වෙ ! අපට කිසි ම බලාපොරොත්තුවක් ඇති කර ගන්න බෑ කියල" කොටියා කීවේ ය.

"ටිකක් ඉන්න, අපි තව කල්පනා කරල බැලුවෙ නෑ නෙවැ" යුලියා කීවා ය.

"ඒක හරි. අපි කල්පනා කරල බලමු" පිඹුරා කී ය.

"ඔයාලට බඩගිනි ද ?" යුලියා ඇසුවා ය.

"ඒ ගැන නම් කරදර වෙන්න එපා. එක ප්‍රශ්නයක් නෙමෙයි" පිඹුරා කීවේ ය.

"අපි බඩගින්නෙ මළොත් අපට හම ගහන එක නම් ප්‍රශ්නයක් වේවි" කොටියා ඇනුම් පදයක් ලෙසින් කීවේ ය.

පිඹුරා නැවතත් සුසුම් ලෑවේ ය. සිය සහායකයාගේ හැසිරීම ගැන ඔහු කරදරයට පත් ව සිටියේ ය.

"ආදරණීය යුලියා, මගේ මිත්‍රයා ඉක්මනින් තරහ යනසුලු සහ අනුන් නුරුස්සනසුලු කෙනෙක් ඒත් ඇත්ත වශයෙන් ඔහු කීර්තිමත් මහාචාර්යවරයෙක්; ඒ වගේ ම මහා පර්යේෂකයෙක්."

"හැබෑට ම ? මම දැන හිටියෙ නෑ නේ" යුලියා කීවා ය. "මම කොහොම ද ඔයාලට කන්න දෙන්නෙ ? ඔයාලට මස් හුහක් ඕන වෙයි නෙ ?"

"අපි මස් කන්නෙ නෑ" පිඹුරා කාරුණික ව කී ය "අපිට තියෙන්නෙ ඔනෑකම් ඉතා ටිකක්. ඒ අතින් අපි ඔයාට බරක් වෙන්නෙ නෑ. අපට ඕනෑ නවතින්න තැනකුත් මිත්‍රත්වයත් විතරයි."

"ඔයාල ඇයි මාව ම තෝරා ගත්තෙ ?"

"වෙන කවුරු තෝරන්න ද ?" කොටියා ඇසී ය. "එහෙනම් අර ළමා පුරෝගාමී සෙමියනොව් – මස් බුදින පුංචි සතුන්ට නිකරුණේ හිරිහැර කරන්නා – තෝරන්න ද ?"

පිඹුරා ඈ තෝරා ගත් හැටි තව දුරටත් විස්තර කෙළේ ය.

"අපි මුළු දවස ම පදුරු අස්සෙ හැංගිලා සෙවිල්ලෙන් සිටියා. ඔයා වැනි විශ්වාසදායක, පළල් අදහස් ඇති, නිර්භීත, ප්‍රෞඪ කෙනෙකු ගැන..."

"තව මහ රෑ නොදන්නා සර්පයෙකු පස්සේ මහ කැළෑවට යන්න තරම් මෝඩ කෙනෙකු ගැනත්..." කොටියා උපහාස වැකි කඩකින් වාක්‍යය සම්පූර්ණ කෙළේ ය.

"අනේ, ට්‍රැන්ක්වෙරි - ට්‍රැන්කෝවෙරි, මේ අවාසනාවන්ත ගොඩ බැසීම නිසා ඔබේ හොඳ ගතිගුණ ඔක්කොම නැති වෙලා" යළි සුසුම් ලෑ පිඹුරා අවලාදයෙන් කීවේ ය.

"මම නිතර ම කියන්නේ ඇත්ත" යනුවෙන් ඔහුට පිළිතුරු දුන් කොටියා යුලියා දෙසට හැරී "අනේ, මේ මගේ බැන්ඩේජය බලනව ද ?" ඇසී ය.

එලෝ වාසින් දෙදෙනා විසින්, රෙදි වනන වැලක නිබී ගන්නා ලද කොටිට උරයකින් සකස් කර ගන්නා ලද්දක් නිසා එය හොඳින් සවි කිරීමට අමාරු විය. ඇරත්, මුළු කාලය තුළ ම කොටියා අවලාද නහන්නටත් ඇට බාධා කරන්නටත් වූ නිසා පැයකට පමණ පසු ඈ සිය කුටියට ගොස් තද නින්දට වැටුණා ය.

03

අප අතරේ නපුරු සත්තු

පසු දා උදැසන කඳවුරේ බියුගල් නාදයට යුලියා අවදි වුවා ය. ඊයේ රෑ තමා දුටු හිනයේ එකට කැලැති තිබූ සිදුවීම් සියල්ල මතකින් ඉවත් කිරීමට ඇට නොහැකි විය. තව ම සිතුවිලි පැහැදිලි නැතත් ඈ ව්‍යායාම කිරීම සඳහා දිව ගියා ය.

ගෙයින් පිටත දැඩි සීතල ය. කොඩි ගහට පිටුපසින් වලාකුළු බොහෝ පහතින් පා වෙයි. කඳවුරු සීමාවේ සිට පැතිර ඇති වනය මතින් නෙත් යැවූ ඇට ගෙවුණු රාත්‍රියේ සිදු වූ සියල්ල සිහිනයක් නො වන බව පැහැදිලි විය. ඈ නො ඉවසිල්ලෙන් කැළය දෙස බලා ගෙන සිටියා ය. පිටස්තර ග්‍රහලෝකයකින් පැමිණි සතුන් එහි සිටින බව ඈ දනී.

"මට ඕනෑ මගේ අලුත් යාළුවන් ඔයාට අඳුන්වා දෙන්න" ඈ fපිමා අමතා කීවා ය.

"මට පේනවා ඔයාට ඉස් ගෙඩියෙක් හමු වෙලා බවත් ගෝනුස්සෙක් එක්ක යාළු වෙන්න හදන බවත්" fපිමා කීවේ ය.

"හුගක් දුරට හරි" යුලියා කීවා ය.

ඇගේ සිරුරේ සීරීම් හා තුවාල පරීක්ෂා කරන්නට යාමට වෛද්‍යවරිය ආ නිසා ඇට ඉතිරි හරිය කියන්නට ලැබුණේ නැත.

fපිමා ඈ ආපසු එන තුරු පමා වීමට සිතුවේ ය. එහෙත් තමා දුන්නක් සෑදීමට යන බවත් ඊට සුදුසු ඇද නැති සිහින් ගහක් කැලේ අනික් පැත්තේ පදුරක තිබෙන බව තමා ඊයේ දුටු බවත් ඔහුට මතක් විය. ඊයේ ඔහුට පිහියක් තිබුණේ නැත. එහෙත් අද ඔහු පළමු වන කඳවුරේ ළමයකුගෙන් ලොකු පැන් පිහියක් ඉල්ලා ගෙන ඇත. එය ඉක්මනින් ආපසු බාර දීමට

ද පොරොන්දු වී ඇති නිසා කාලය නාස්ති කරමින් නිකම් බලා සිටීමට ඔහුට බැරි ය. ඔහු වැට ළඟට ගොස් එහි කපොල්ලෙන් රිංගුවේ ය. පෑන් පිනිය අතට ගත් fපිමා තමා දුටු පදුර ගැන විපරම් කරමින් ඉදිරියට ගියේ ය.

ඒ මොහොතේ ම ඔහුගේ දෙපා ළඟින් විශාල වූ ද, කහ පාට වූ සහ වයිරම් වැටුණා වූ ද කිසිවෙක් වේගයෙන් පළා ගියේ ය.

වැඩියෙන් බය වුණේ කවුරු දැයි කියන්නට බැරි ය. fපිමා කොරලොව් ද ? නැත හොත් බෙංගාලි කොටියෙකුගේ වෙසින් සිටින ට්‍රැන්ක්වේරි – ට්‍රැන්කෝවේරි යන අමාරුවෙන් කියැවෙන නමක් ඇති එලොවින් ආ අමුත්තා ද ? කොටියා විය හැකි යි. fපිමා මාන බලන්නේ තමාට පහර දීමට යැයි සිතූ ඔහු වහා දුව ගොස් ගං ඉවුමේ බට පදුරු අතරේ සැඟවුණේ ය. වැට අස්සෙන් රිංගා පලා ගිය fපිමා අඩි පාර දිගේ දුව ගොස් ගිලන් හලේ සිට ආපසු එන යුලියාගේ ඇහේ හැපී නැවතුණේ ය.

"කොහෙද ඔයා දුවන්නේ, හරියට පස්සෙන් කොටියෙක් එළවං එන්නා වගේ ?" හදිසියේ නැවතුණ යුලියා ඇසුවා ය. එහෙත් ඇගේ විහිළුව සත්‍යයට ඉතා කිට්ටු ය.

fපිමා තමාගේ සුදුමැලි මුහුණෙන් පිටට පැන්න ගොරොක් ගෙඩි මෙන් රතු පාට ඇස්වලින් ඈ දෙස බලා යළි බියෙන් මෙන් වට පිට බැලුවේ ය.

"ඔයා පිඹුරෙක් දකින්න නෑ මං හිතනවා" යුලියා කීවා ය.

"මොකෙක් ?"

"පිඹුරෙක්, මීටර් හයක් විතර දිග."

යුලියා එහෙම ඇසුවේ හැබෑවට ම ය. එහෙත් ඈ තමාට සරදම් කරන බවත් තමා රවටන බවත් fපිමා සිතුවේ ය. මක් නිසා ද, ළමා පුරෝගාමී කඳවුර අසල කොටි ගැවසෙන බවත් ඔවුන් මිනිසුන්ට පහර දෙන බවත් කිසිවෙකු විශ්වාස නො කරන නිසා ය.

"මට තේරෙනවා" පිනිය සාක්කුවේ දමා ගෙන ආපසු යන්නට සැරසෙමින් fපිමා කීවේ ය. ඊයේ ඇගේ හොඳ යහළුවකු ව සිටි ඔහු මෙසේ රවටනු ලැබීමට සුදුස්සෙක් නො වේ. ඊට සරදමකින් ම පිළිතුරු දිය යුතු ය. "මට තේරෙනවා, එහෙ අලියෙකුයි කිඹුල්ලු දෙන්නෙකුයි ඉන්නවා."

"එහෙ අලියි කිඹුල්ලුයි නෑ, එහෙ ඉන්නෙ කොටියෙකුයි පිඹුරෙකුයි විතරයි."

යලියා විනීත ස්වරයෙන් හැබෑවට ම කීවේ මේ වචන ඇසීමෙන් fපිමා පුදුමයට පත් වූයේ ය.

"හහ් – හා" කියමින් පියවර දෙකක් ඉදිරියට ගිය ඔහු ඈ දෙස බලා "ඇත්තට ම ඔයා මාව රවටන්න හදනවා ද ?" ඇසුවේ ය.

"මම ? මම මේ ඔවුන් හමු වෙන්න යනවා. මට ඔවුන් එක්ක කතා කරන්න ඕනෑ" යූලියා පැහැදිලි කළා ය.

"කා එක්ක ද ?"

"කොටියයි පිඹුරයි එක්ක."

fපිමා තමා පසු පස එතැයි හිතා ගෙන යූලියා කැළය දෙසට ගියා ය. එහෙත් fපිමා ගියේ නැත. ඔහු තමාට අහන්ට ලැබුණ පුදුම දේ ගැන සිතමින් හිස කසමින් සිටියේ ය.

"මම හිතන්නෙ ඔයා බය නැතැයි කියල" යූලියා වැටෙන් රිංගන ගමන් ආපසු හැරී බලමින් කීවා ය.

"මම ?" fපිමා සිටි තැනින් නො සෙල්වී ඇසුවේ ය. "කාට ද ?"

"එහෙනම් එන්න" කී යූලියා ආපසු නො බලා ම පඳුරු අතරේ නො පෙනී ගියා ය. එහෙත් fපිමා ඈ පසු පස ගියේ නැත.

ඔහු තුළ ඈ පසු පස යාමට කැමැත්තක් ද විය. කොටි මිනිසුන්ට පහර දෙන පෙදෙසට යන මේ උමතු ගමනින් යූලියා වළක්වා ගැනීම තමාගේ යුතුකම බව ඔහු සිතුවේ ය. එහෙත් ඔහුගේ දෙපය කැළයට යාම ප්‍රතික්ෂේප කෙළේ ය.

fපිමා පා එසවිය නො හැකිව සිටින විට පිටුපසින් සොමියනොව් සහ ඔහුගේ අඹියාළුවා වන රෝසි පැමිණියහ. සෙමියනොව් තරහ මුහුණින් සිටියේ ය. ඔහුගේ මුහුණේ පැලැස්තරයක් අලවා තිබිණි. ඔහු සටනින් පැරදී එන සොල්දාදුවෙකු වැනි විය. ඔහු පළි ගැනීමට සැරසී සිටියේ ය. පුංචි දැමයින් ඇතුළු හැම දෙනා ම දෙවනා දිනටත් කොලොප්පම් කිරීම නිසා ඔහුගේ හිතේ අමාරුව වැඩි වී තිබුණේ ය. එහෙත් යූලියාට පහර දීමට තරම් ධෛර්යයක් ඔහුට නො වී ය. කළ යුතු දේ ගැන නිශ්චයක් නැති ව පටු පාර දිගේ ගමන් කළ ඔහුට අහම්බෙන් fපිමා හමු විය.

"කෝ ඔයාලගෙ යූලියා ?" සෙමියනොව් තර්ජනාත්මක ව ඇසී ය.

"ඇයි ? ඔයාට මොකද ?" fපිමා සෙමියනොවිගේ තර්ජනය ගණන් නො ගෙන ඇසුවේ ය.

ඒත් දැන තමාගේ පාද සෙමියනොව්ගෙන් ඔනෑ තරම් ඉවතට ගෙන යාමට සූදානම් බව fපිමාට හැඟුණේ ය.

"මෙයා එක්ක කතා කරන එකෙන් ඇති වැඩේ මොකක් ද ?" රෝසි තමාගේ උපැස් යුවළ ගලවා සිය දමන ගමන් ඇසුවේ ය. "යූරා, මම ඔයාට කියන්නෙ මේ ඔත්තුකාර ද්‍රෝහියාට පාඩමක් උගන්වන එකයි."

''මෙයා ද්‍රෝහියෙක් ද ?'' සෙමියනොව් ඇසී ය. දැනට ම පාසල් දෙකකින් නෙරපා දමනු ලැබ ඇති, ඇහපතේ මහත මිස මොළය කළඳක් නැති ඔහු නියම මොට්ටයෙකි. බැළලියගේ වලිගයේ බෙලෙක්කයක් එල්ලීම කදිම විහිළුවක් බව රෝසි කියා දුන්නේ නැත් නම් ඔහු ඒක වත් කරන්නේ නැත.

''ඇත්තෙන් ම එයා යූලියාගේ යාළුවෙක් නම් ඔයාට ද්‍රෝහියෙක් තමයි'' කියමින් රෝසි නැවත උපැස් යුවළ ලා ගත්තේ ය.

''ඔහෙ හිටු ද්‍රෝහියා'' යැයි උස් හඬින් කියමින් සෙමියනොව් fපිමා වෙතට කඩා පැන්නේ ය. ඔහු තමාට පහර දීමට එන බව දුටු fපිමා කැළය දෙසට දුවන්ට විය.

සෙමියනොව් ඔහු පස්සේ එළවන්ට විය. අඩි පාර දිගේ ශාරීරික අභ්‍යාස උපදේශක ස්ටෙපානිච් ආ නිසා රෝසි එතැන ම වාඩි වී බිම අහ ගාන්නට පටන් ගත්තේ ය.

''කොහෙද ඔයාගෙ යාළුවා දුවන්නෙ ?'' ශාරීරික අභ්‍යාස උපදේශක රෝසිගෙන් ඇසී ය.

රෝසිගේ ලොකු කණ්ණාඩි සහිත කුඩා මුහුණ ශාරීරික අභ්‍යාස උපදේශක වෙත යොමු විය.

''ජීව විද්‍යාව'' ඔහු මෘදු සහ විනීත ලෙස හෙමින් කීවේ ය. ''පාසල නැවත පටන් ගත්තා ම අපි දිස්ත්‍රික්කයේ උද්භිද සහ සත්ත්ව වර්ග ගැන වාර්තාවක් ලිවීමට තීරණය කළා. මම ශාක වර්ග ගැන හදාරනවා.''

''හහ් – හා, මොනවද සෙමියනොව් හදාරන්නෙ ඔය තරම් වේගයෙන් ?''

''සමනලයෝ'' රෝසි පිළිතුරු දුන්නේ ය. ''එයා පිහාටුවල පුල්ලි තියන 'සුදු ගෝවා' වර්ගයේ ලොකු සමනලයෙකු පස්සේ එළවා ගියා.''

වෙන කවුරු වත් මේ කතාව කීවා නම් සෙමියනොව් පුල්ලි සමනලයෙකු පස්සේ එළවා ගිය බව වත් ඔහු උන් ගැන වාර්තාවක් ලියන බව වත් ස්ටෙපානිච් විශ්වාස කරන්නේ නැත. එහෙත් නිහතමානී රෝසිගේ කීම ඔහු විශ්වාස කෙළේ ය. ස්ටෙපානිච් පටු පාර දිගේ ගොස් වංගුවෙන් හැරුණ පසු රෝසි පරිස්සමින් නැඟී සිට මිටෙහි වූ සුන් බුන් ඉවත විසි කර කැළය දෙසට පා නැහුවේය.

මේ අතර යූලියා කඩිසර ලෙස පිඹුරා සෙවීමෙහි යෙදුණා ය. ඌ ඇද වැටුණ ගහක කඳට පිටුපසින් බඩ ගා ඔය පැතලි හිස සලා ඇට ආවාර කෙළේ ය.

''ඔයා හැංගෙන්නෙ මොකද ?'' යූලියා ඇසුවා ය.

''අපව හොයනවා'' පිඹුරා පිළිතුරු දුන්නේ ය.

"කවුදෝ පිහියකින් කොටියාට පහර දෙන්නට ආවා. යන්තම් වෙලාවට බට පඳුරු අස්සේ හැංගිලා බේරුණා."

"ඒ ඔක්කොම මම දන්නවා" යුලියා කිවා ය. "ඒක පොඩි පට-ලැවිල්ලක්. දැන් එයා මෙහාට ඒවි. මම ඔයාල එයාට අඳුන්වා දෙන්නම්. එයා මගේ හොඳ ම යාළුවා."

"අනේ මං දන්නෙ නෑ. අපේ ට්‍රැන්ක්වේරි – ට්‍රැන්කෝවේරි, හොඳට ම බය වෙලා" පිඹුරා සුසුම් ලැවේ ය.

"ඉතින් කොහොම ද ඇන්නැවේ ඔයාල ඉන්දියාවට ගිහින් ජීවත් වෙන්නෙ ? එහෙ නෙ නියම දඩයක්කාරයෝ ඉන්නෙ."

"ඒක රාජ්‍ය රක්ෂිත වනය – අභය භූමියක් නොවැ. අපට මෙහෙ නීතියෙන් ආරක්ෂාවක් නැහැ."

"එහෙනම් අපි පොලිසියට* යමු. අපට එහෙ දී සම්පූර්ණ කතාව කියල උදව් ඉල්ලන්න පුළුවනි" යුලියා යෝජනා කළා ය.

"අපෝ, මොන තත්ත්වයක් යටතේ වත් බැහැ" පිඹුරා එයට විරුද්ධ විය. "වෙන කවුරු වත් දැන ගන්න ඕනෙ නෑ අපි මෙහෙ ඉන්න බව ඒක රහස්‍ය භාවය රැකීමේ මූලික නීතිය කඩ කිරීමක්."

වල් මීමුන් රංචුවක් කැළැව බිඳ ගෙන එන්නාක් වැනි හඬක් ගහ පැත්තෙන් ඇසුණේ ය. යුලියා දුව ගොස් ගහක කඳක් මුවාවේ නැවතුණා ය. ගහ දිගේ ඉහළට බඩ ගෑ පිඹුරාගේ බරට එය පහළට නැමුණේ ය.

එහෙත් ඒ හඬ නැගුණේ අන් කිසිවකින් නො ව කැළය මැද එළිමහන් පිටිය වෙත දුව ආ fපිමා කොරලොව්ගනි. තමා ඉදිරියේ ඇත්තේ කුමක් දැයි නොදත් ඔහු කෙළින් ම යුලියා සිටි ගහ වෙතට දිව්වේ ය. නැමුණ ගහේ නවනින්නට බැරි ව ඇද වැටුණු මීටර් පහක් දිග පිඹුරා fපිමාගේ හිස මත කඩා වැටුණේ ය.

එක ගොඩේ බිම පෙරළුණ ඔවුහු තිදෙනා මිනිත්තුවක් පමණ නො සෙල්වී වැනිර සිටියහ. පළමුවෙන් සිහි ලැබුවේ යුලියා ය. ඈ නැඟිට අන්දුන් කුන්දුන් වී සිටි පිඹුරා තවමත් ගැටුමෙන් කම්පිත ව සිටි fපිමා කෙරෙන් ඉවතට ඇද්දා ය. බෙලහින නැමෙනසුලු බර පිඹුරා ඇඳක් මත වූ දිග බේල කොට්ටයක් වැනි ය. fපිමා සිහි නැති ව සිටින්නාක් මෙන් පෙනුණි. ඇස් ඇරවීමට ඔහුගේ මුහුණට අතුල් පහර කීපයක් දීමට යුලියාට සිදු විය.

"ආයෙත් ඇවිල්ලා" fපිමා කිවේ ය.

"ඔයාට අමාරු ද ?" යුලියා ඇසුවා ය.

---

* අපේ පොලිසිය වෙනුවට සෝවියට් දේශයේ ඇති මහජන ආරක්ෂක සංවිධානය 'මිලිෂියා' (Militia) නම්. කතාව තේරුම් ගැනීම පහසු වනු සඳහා ඒ වෙනුවට පොලිසිය යන්න යොදන ලදී.

"ආයෙත් කොටි ඇවිල්ලා" fඒමා යළිත් කී ය.

"නැහිටින්න. අපට ඒ ගැන සියලු විස්තර කියන්න."

"මට බෑ මගේ ඇඟ පත රිදෙනවා. මා පිටට ගහක් කඩා ගෙන වැටුණා."

"ඒ ගහක් නෙමෙයි. මගේ අලුත් යාළුවා. මට ඕනෑ ඔයාට ඒ දෙන්නා අඳුන්වා දෙන්න."

04

ළමා කඳවුර බියෙන් සැලෙයි

යුලියා පෙන්වූ දිසාව යන්තමින් බැලූ fපිමා බියෙන් හැකිළී ඉවත් ව යනු සඳහා නැහිටින්නට උත්සාහ කළා ය.

''හලෝ'' යනුවෙන් පිඹුරා ඔහු ඇමතුවේ ය. ''මට 'කෙන්' යනුවෙන් අමතන්න. ඇත්ත වශයෙන් මම උරගයෙක් වගේ පේනවා විතරයි. සාමාන්‍යයෙන් මම අපේ දුරස්ථ ග්‍රහ ලෝකයේ විද්‍යාලයක ඉතිහාස විද්‍යාව ගැන දේශන පවත්වනවා.''

fපිමාට බුද්ධිය මෙහෙයවා සිතන්නට හැකියාව ලැබුණේ විනාඩි දහයකට පමණ පසු ය. එහෙත් ඔහු ජීව විද්‍යාත්මක ව කරුණු සලකා බලන්නට අපොහොසත් විය. ඔහුට අලුත් අමුත්තාගේ අමුතු පෙනීම ගැන හුරු පුරුදු වීමට අමාරු විය. අජටාකාශ පර්යේෂණ සහ ගමන්බිමන් බෙහෙවින් ඔහුගේ සැලකිල්ලට භාජන වූවකි. සුදුසු කාලය පැමිණි විට තමා ම අජටාකාශයට යාම ඔහුගේ බලාපොරොත්තුව විය. ඒ නිසා පිඹුරා අදහස් කරන දේ අවබෝධ වූ විට ඔහු ඇත්ත කියනි යි පිළිගත් fපිමා සතුටට පත් විය. ඔහු පිටියේ එහාට මෙහාට සක්මන් කරමින් තමාට ම මෙසේ හෙමින් කියා ගත්තේ ය :

''ලෝක අතර සබඳතාව මිනිස් වර්ගයාගේ ඉපැරණි සිහිනය යි. ඔබ සමඟ අපටත් අභ්‍යවකාශයේ ඔබ්බට ම යන්න පුළුවනි. ඔබේ යන්ත්‍රය ක්‍රියා කරන්නේ කුමන මූලධර්මය උඩ ද ?''

''අවාසනාවකට එය තව දුරටත් ක්‍රියා කරන්නේ නෑ. එය කැඩුණා.''

''එහෙනම් අපි ඒක නැවත සවි කරමු.''

''අපි ඒක විනාශ කර දැම්මා. යන්ත්‍රයේ රහස කා අතට වත් නොයන්නට.''

"ඒක මෝඩකමක්. දැන් ඔබට ඔප්පු කරන්න අමාරුයි, ඔබ ඇත්ත වශයෙන් ම පිට සක්වළින් ආ අය බව. මිනිස්සු පිට සක්වළින් එන අමුත්තන්ට වඩා කතා කරන පිඹුරන් විශ්වාස කරන්න කැමති වේවි."

"අපට ඒක ඔප්පු කරන්න ඕනකමක් නෑ" පිඹුරා නැවත නැවතත් කී ය.

"අපට ඉන්දියාවට යන්න ඕනෑ. එතනින් අපේ ලෝකයට යන්න."

"ඒක ප්‍රශ්නයෙන් පිටයි" fපිමා කී ය. "ඔබ ඔක්කෝට ම ඉස්සෙල්ලා අපේ ළමා පුරෝගාමීන් හමු වෙලා ඔවුන්ට ඔබේ සාර්ථකත්වයන් විස්තර කර දෙන්න ඕනෑ. ඊට පස්සෙ අපි විද්‍යා ඇකඩමියටත් තරු ගමන් පිළිබඳ මධ්‍යස්ථානයටත් යමු."

පිඹුරා සුසුමක් හෙළුවේ ය. යුලියා අනුකූලතාව දැක්වූවා ය. ඔවුන්ට කළ යුතු වැඩක් - සම්පූර්ණ කළ යුතු කාර්ය භාරයක් - තිබේ. එහෙත් fපිමා එයට මුළුමනින් වෙනස් දෙයත් ඉල්ලා සිටී. ඈ සිය මිතුරාගේ වේගවත් කතාව නවත්වන්නට සැරයෙන විට ඇතින් ඉතා දරුණු කැගැහිල්ලක් ඇසුණේ ය.

"මොකක් ද ? මොකක් ද ?" තැති ගත් උරගයා ඇසී ය. "ඇත්තෙන්ම මගේ මිත්‍රයාට කවුරු හරි පහර දීලා වෙන්න ඕනෑ. බට පදුරු අතරෙ දී අහු වෙලා."

පළමුවෙන් ම ගහ ළඟට දිව ගියේ යුලියා ය. ඊ ළඟට ඇට එකතු වෙන්නට උත්සාහ කරමින් fපිමා දිව්වේ ය. පිඹුරා පස්සෙන් ම ගියේ ය. ඔවුන්ට ඉක්මනින් ම දුක් බර පෙනුමක් ඇති අජටාකාශ නාවික ට්‍රැන්ක්වේරි-ට්‍රැන්කෝවේරි ගමු විය. ඔහුගේ බැන්ඩේජය ඇලවී බෙල්ලට වැටී බිසයකට දුවන මිනිහෙකුගේ ගෙල සාලුවක් (Scarf) මෙන් පැද්දෙමින් තිබුණේ ය. වියළි බට කොළ සහ දිය පාසි ඔහුගේ ලොම්වල ඇලී තිබුණේ ය. කිසියම් හේතුවක් නිසා රෝසිගේ කණ්ණාඩි කුට්ටම ඔහුගේ එක කනකින් එල්ලෙමින් තිබුණේ ය.

"මට හරි අමාරුයි" fපිමා දෙස බලමින් කොටියා කීවේ ය. "වැරදි ලෙස ඩටහා ගන මට හිරිහැර කළා. මට පහර දුන්නා. මම මගේ ලොම් වියළා ගන්නට ගං ඉවුරට වෙලා හිටියා. එතකොට කැලේ පීරා ගන ස්වදේශික තරුණයො දෙන්නෙක් ආවා. එකෙක් ගල්වලින් පහර දුන්නා. අනිකා උගේ කණ්ණාඩි කුට්ටමෙනුත් ගැහුවා."

එවිට ම කඳවුරේ බියුගලය නාද විය. එය රැස්වීමක් සඳහා ය.

"මේක අමුත්තක් ! මට පුදුමයි. මොකද කියලා ?" යුලියා කීවා ය.

"ඒක අප ගැන අනතුරු ඇඟවීමක් වෙන්න පුළුවන්" පිඹුරා කී ය.

Scarf = කර වටේ දමන සාළුව: උතුරු සළුව.

''ඔය ගොල්ලො මෙහෙ ඉන්න'' යුලියා කඩිසර ලෙස අණ කළා ය.

''අපි කඳවුරට දුවල බලන්නම්. අනතුරක් නම් දන්වන්නම්.''

පුරෝගාමියෝ සෑම අහුමුදුවලින් ම රැස්වීම භූමිය කරා රොක් වන්නට වූහ

බියුගලය පිඹින්නා ළඟ උදරම් පෙනුමකින් යුත් අධ්‍යක්ෂක ඇබ්සින් සහ ශාරීරික අභ්‍යාස උපදේශක ස්ටෙපානිව් සිටියහ. යුලියා ඔවුන් පිටු පසින් සිටි සෙමියනොව් සහ රෝසි වහා හඳුනා ගත්තා ය.

අවසානයේ දී පුරෝගාමීන් හැම දෙනා ම අනුපිළිවෙළින් පෙළ ගස්වා පරීක්ෂා කරන ලදි. සියල්ලෝ ම තම තමන්ට අයිති තැන්වල සිටියහ. එකෙකුත් අඩු නැති බව පැහැදිලි වූ විට අධ්‍යක්ෂකතුමා සැනසිලි සුසුමක් හෙළා ලේන්සුව ගෙන මුහුණ පිස දැම්මේ ය.

''හැම දෙනා ම තම තමන්ගේ කුට්ටලට යන්න ඕනෑ කණ්ඩායම් නායකයනුත් ඔවුන් කැටුව යන්න ඕනෑ. කවුරු වත් මගේ විශේෂ අවසර-යක් නැති ව කඳවුරු භූමියෙන් පිටතට යෑම සම්පූර්ණයෙන් තහනම්.''

''මොකද වුණේ ?'' හැම පැත්තෙන් ම හඬ නැඟෙන්නට විය.

අධ්‍යක්ෂතුමා කියන්න ද නොකියන්න දැයි දෙගිඩියාවට පත් විය. ඔහු ස්ටෙපානිව් දෙස බැලුවේ ය. කාරණය තමන් අතට ගැනීමට හොඳ ම වේලාව මෙය බව ස්ටෙපානිව් තීරණය කෙළේ ය.

''සවන් දෙන්න'' ඔහු තමාගේ හොඳම ශාරීරිකාභ්‍යාස ස්වරයෙන් හඬ නැඟී ය. ''කඳවුර අවට ප්‍රදේශවල වල් සතුන් දකින්න ලැබුණ බවට වාර්තාවක් තියනවා. අපි මේ ආරංචිය පරීක්ෂා කර බලන්න ඕනෑ. ඇත්ත වශයෙන් මෙය වැරදීමක් වෙන්නත් හොඳට ම ඉඩ තියනවා.''

''ඒක වැරදීමක් නොවෙයි. නෝ එහෙනම් මගේ කණ්ණාඩිය?'' රෝසි කෑ ගැසුවේ ය. තුන්වෙනි කණ්ඩායමේ පේළියෙන් යුලියා ග්‍රිබ්කෝවාගේ හඬ ඇසුණේය. ''රොසොව්, මෙන්න ඔයාගේ කණ්ණාඩි කුට්ටම, මීට පස්සෙ අවසර නැති ව නාන්න ගිහිල්ල නැති කර ගන්න එහෙම එපා.''

''මට තේරුම් ගන්න බෑ මගේ කණ්ණාඩි කුට්ටම යුලියාට ලැබුණේ කොහොම ද කියලා.'' රෝසි ආඳර්ශමත් ශිෂ්‍යයෙකුගේ ස්වරයෙන් කී ය. මම ඒකෙන් කොටියෙකුගේ මුණට ගැහැව්ව. ඌව නවත්වන්න.''

''එහෙනම් කොටියා ඒක යුලියාට දෙන්න ඇති,'' කඩුදෝ කී ය. මුළු කඳවුර ම සිනාවෙන් ඇලළී ගියේ ය. අධ්‍යක්ෂකතුමාට පවා හිනා නොවී සිටිනු බැරි වීය.

''ඔබ හැම දෙනා මට කන් දුන්නෙ නැත් නම් කවුරු හරි අමාරුවේ වැටෙවි.''

ඒත් කවුරු වත් ඔහුට කන් දුන්නේ නැත.

''අපි යමු කැළේට'' යුලියා fපිමාට රහසින් කීවා ය.

''පොඩ්ඩක් ඉන්න'' fපිමා කීවේ ය.

යම් කිසි දෙයක් ගැන නිහඬ සාකච්ඡාවක යෙදී සිටින අධ්‍යක්ෂක සහ ශාරීරික අභ්‍යාස උපදේශක fපිමා ඉඟියෙන් පෙන්වී ය. අධ්‍යක්ෂකතුමා තමාගේ කාමරයට ගියේ ය. ඒ අතර ස්ටෙපානිච් තමාගේ ශාරීරිකාභ්‍යාස ස්වරය පාවිච්චි කෙළේ ය.

''වැඩිපුර දන්වීමක් කරන තුරු අධ්‍යක්ෂකතුමාගේ නියෝගය බල පවත්වනවා. කිසි කෙනෙකුට කඳවුරෙන් පිටත යාම තහනම්.''

විරුද්ධතාවලට ඇහුම්කන් නොදී ස්ටෙපානිච් යුහු ව අධ්‍යක්ෂක පසුපස ගියේ ය.

කිසිවෙකුට නොදැනන්නට පසෙකට ලිස්සා යන්නට සමත් වූ යුලියා සහ fපිමා පදුරු අතරින් ගොස් අධ්‍යක්ෂක කාමරය පිටුපසට ළඟා වූහ. ජනේලය හැර තිබුණෙන් අධ්‍යක්ෂකතුමා ටැලිෆෝනයෙන් එහි අනික් කොනේ සිටි අයට මෙසේ කියනු ඔවුන්ට ඇසුණි.

''ඇත්තෙන් ම කට කනාව බොරුවක් වෙන්නත් පුළුවනි. ඒත් මම ඔබට කියනවා සත්ත්වෝද්‍යානයකින් හරි සර්කසයකින් හරි කොටියෙක් පැන ගියා ද කියා සෙයා බලන්නට. මෙහෙ ළමයි දෙසීයක් විතර ඉන්නවා. මට බෑ අවදානමකට මුහුණ දෙන්නට අපි කාට වත් කැළෑවට යාමට ඉඩ දෙන්නෙ නෑ. ඔව්, මම නවතින්නම්.''

රිසීවරය ඉවතින් තැබූ අධ්‍යක්ෂකතුමා ස්ටෙපානිච් අමතා මෙසේ කී ය :

''පොලිසිය කියනවා කරදර වෙන්න එපා කියල. වහා ම පරීක්ෂා කරනව ලු. කැළෑව පරීක්ෂා කරන්නට බල්ලෙකුත් සමඟ කෙනෙක් එවනව ලු.''

05

අමුත්තන්ට රැකවරණ

එලොවින් ආ අමුත්තෝ සුවව ලෙස කල් ගෙවූහ. බෙල්ලෙන් එල්ලෙන බැන්ඩේජ් යළුව සහිත ව කොටියා පිටියේ ඔබ මොබ සක්මන් කෙළේ ය.

පයින් ගහක එතුණ පිඹුරා පහත අත්තකින් හිස වසා ගෙන ගැඹුරු සිතුවිලිවල ගැලී සිටියේ ය.

''ඔයා කියන්නෙ ඔයාට පොලිසිය හමු වන්න ඕනෙ නැතැයි කියල ද ?'' පිටිය දෙසට දුව ආ යුලියා කොටියාගෙන් ඇසුවේ ය.

''කොහෙත් ම ඕන නෑ. ඇයි, ඔවුන් මෙහාට එනව ද ?''

''ඔවුන් ඉක්මනින් මෙහාට ඒවි'' fපීමා කීවේ ය. දැන් ඕහු වෙත කලින් තිබුණු බියගුලු බවේ ලකුණක් වත් නැත. ඇත්තෙන් ම මිනිස්සු ඕනෑ ම දේකට පුරුදු වෙති.

''ඇයි, මොකද වුණේ ?'' පිඹුරා තමාගේ තුන් කොන් හිස ඔවුන්ට ඉහළින් පද්දමින් ඇසුවේ ය.

''මේ බළල් වධකයා මුළු කඳවුර ම ගිනි තිබ්බ නෙ'' fපීමා පැහැදිලි කෙළේ ය. ''කොටියා මුළුමනින් ම හිතේ ඇදුණු මායාවක් බව ඔප්පු කිරීමට අපට බොහොම දේවල් කියන්න සිදු වුණා.''

''ඉතින් මොකද පොලිසියෙන් මෙහෙ එන්නෙ ?''

''ඔයාල හමු වෙන්න.''

''අපිට ඔයාලගෙ උතුම් පොලිසිය හමු වෙන්න බෑ. අපි එහෙම කලොත් අපෙන් තාරකා මණ්ඩල නිති කැඩෙනවා. අපේ දූත මෙහෙවරත් විනාශ වෙනවා'' පිඹුරා කීවේ ය.

"අපි ඔයාල ආරක්ෂා සහිත වෙන තැනකට ගෙන යන්න ඕනෑ" යුලියා කීවා ය. "මම අදහස් කරල තියනවා දූපතේ මඩුවක් ගැන – ගොවීන් පිදුරු දමන්න පාවිච්චි කරපු."

යුලියා අදහස් කෙළේ මුළුමනින් තැනිතලා බිමක් වූ ගඟේ පිහිටි දිගටි දූපතකි. දූපත ඉවුරෙන් වෙන් වූයේ තරමක් පටු දිය පාරකිනි.

ඔවුන් දූපතට යා යුතු ව තිබුණේ කඳවුර පැත්තෙන් නො ව කිලෝ මීටර් බාගයක් පමණ ගුහ පහළට යාමෙනි. ඔවුහු කඩිනමින්, එහෙත් පරෙස්සමින් ගියහ. හොඳ ඇස් පෙනීමක් සහ ඉක්මන් ක්‍රියාකාරිත්වයක් ඇති යුලියා පෙරමුණේ ම ගියා ය. ඊ ළඟට fසීමා සහ කොටියා ගියහ. කවුරු හරි එත් දැයි බලමින් පිඹුරා පෙරහැරේ පසු කොන සම්පූර්ණ කෙළේ ය.

ඕනෑ ම කෙනෙකුට පාවිච්චි කළ හැකි, තනි හබලක් සහිත පරණ ඔරුව මෙගොඩහ ඉවුරේ ඇතැයි යුලියා සිතා සිටියා ය. කඳවුරේ සහ ගහ පහළ ඇති ගමේ සමහර උමයි මසුන් බාන්නටත් නාන්නටත් දූපතට යාමේ දී මේ ඔරුව පාවිච්චි කළහ. හරියට ඔවුන්ට විරුද්ධ ව කළ දෙයක් මෙන් ඔරුව එහා වෙරළේ තණ පඳුරු අතර ගිල්වා තිබුණේ ය.

"අපිට පීනන්නයි වෙන්නෙ" යුලියා කීවා ය.

"මට පුළුවන් වේවි ද කියල කියන්න බෑ" පිඹුරා කීවේ ය. "මම කවදාවත් පීනල පුරුද්දක් නෑ. මම දිය නයෙක් නෙමෙයි නෙ."

fසීමා නිහඬ ව සිටියේ ය. ඔහුටත් හරියට පීනන්න බැරි ය. එහෙත් ඒ බව කියන්නටත් ඔහු කැමති නැත. මඩුව බලාත්කාරයෙන් අල්ලා ගන්නට යන මේ පිරිස දෙස යුලියා බැලුවා ය. නාස්ති කරන්න කාලයක් නැත. ඈ සපත්තුව පයින් ම ඉවතට ගසා දමා දුව ගොස් දියට පැන්නා ය. දූපතත් ඉවුරත් අතර වූ පටු දිය පාර ගැඹුරු ය ; දැඩිගවත් ය. ඈ දූපතෙනුත් පහළට ගෙන යාමට තරම් දිය පාර වේගවත් විය. අමාරුවෙන් දූපතේ පහළ කෙළවරට ගොඩ වූ ඈ ඔරුව තිබෙන තැනට දිව්වා ය. අගේ පා පන් ගස්වලට කැපුණි. පා ඇඟිලි බුරුල් මඩේ එරුණි. ඔරුවේ වතුර පිරී තිබූ නිසා ඇට ඒවා ඉසින්නට සිදු විය. වතුර ඉසින ගමන් ඈ අහක් ඉවුර දෙස බැලුවා ය. පිඹුරා දරණ ගසා ගෙන හිස උඩට ඔසවා සිටියේ ය. fසීමා ඇට සහයෝගය දක්වමින් දණක් පමණ වතුරට බැස සිටියේ ය. කොටියා කුඩුවක දැමූ එකෙකු මෙන් බයාදු ලෙසින් ඉවුරේ එහාට මෙහාට යමින් සිටියේ ය.

හබල බර නිසා ඉන් පැදීම අමාරු බව පෙනුණි. ඔරුව ඇට කීකරු නොවී රවුමට කරකැවෙන්ට විය. එහෙත් යුලියා වඩා ම වෙහෙසට පත් කෙළේ ඇ ඉක්මන් විය යුතු ය යන හැඟීම ය. අන්තිමේ දී ඈ ඔවුන් වෙතට ආ විට fපීමා ඔරුව නොසෙල්වී සිටින්නට එහි ඇණියෙන් අල්ලා ගත්තේ ය. ඉන් පසු දිග පිඟුරා ඔරුවට බඩ ගැවේ ය. fපීමා හබල ගෙන යුලියා ඇමතුවේ ය.

''ඔයා මෙහෙ ඉන්න. මම මේ දෙන්න එගොඩහට ගෙන යන්නම්.''

යුලියා හිස වනා එය අනුමත කර කොටියාට හතර ගානෙන් ඔරුවට නගින්නට උපකාර කළා ය. ඉන් පසු ඈ ඔරුව දියට තල්ලු කළා ය. එහෙත් ඔරුව පසුපස පීනා යාමට දෙවැනි සිතුවිල්ලක් ඇට ඇති විය. මගින්ගේ බර නිසා ඔරුව මුව විට දක්වා ම වාහඟ දියේ ගිලී තිබුණි. ඊටත් වඩා fපීමා ගස්සමින් පැදීම නිසා එය තදින් පැද්දුණේ ය. ඔරුව පැද්දෙන විට කොටියා බියෙන් වෙව්ලුවේ ය. වාසනාවකට මෙන් ඔවුන්ට අනතුරක් නැති ව දූපතට ළඟා විය හැකි විය.

යුලියා තමන් සමඟ ම පීනා එන බව fපීමා දැන ගත්තේ ඔරුව අනික් ඉවුරට ළඟා වූ පසුව ය.

එලෝ වැසියෝ පිදුරු මඩුවේ තැන්පත් වූහ. ඔවුහු සුව පහසු ඇති ව සිටි නමුත් පැහැදිලි ව ම කැලඹී සිටියහ.

''කනගාටු වෙන්න එපා, ඇඳිරි වැටුණ හැටියේ ම කළ යුතු දෙයක් ගැන සලකා බලන්නට අපි එන්නම්'' යුලියා කීවා ය.

මඩුවෙන් එළියට දිව් යුලියාට තවත් සිතුවිල්ලක් පහළ විය. ඈ fපීමාත් සමඟ ඔරුව වෙරළ දිගේ කඳවුරට නොපෙනෙන අනික් පැත්තට ඇද ගෙන ගියා ය. fපීමාට හරියට පීනන්නට බැරි නිසා ඔහුට උපකාර කිරීමට ද ඇට සිදු විය. දිය පාර හරහා පීනා ගිය ඔවුහු කඳවුර කරා දිවූහ.

එවිට ම හැම දෙනා රැ කෑම සඳහා කැඳවන බියුගලය නාද විය.

ඔවුන් කැන්ටීමෙන් පිට වෙන විට කිසිවෙකු තමා දෙස ඕනෑකමින් බලා සිටිනු යුලියාගේ නෙතට අසු විය. රෝසි පයෙකින් සිට ඇගේ පා දෙස බලා සිටියේ ය.

තමාගේ පාදවල දණහිස දක්වා රොන් මඩ තැවරී ඇති බව යුලියාට සිහි වූයේ එවිට ය.

රෝසි නරුම ලෙස සිනා සුණේ ය.

06

පොලිසිය සහ එලොවියෝ

බියකරු පෙර නිමිති යුලියා පිඬාවට පත් කෙළේ ය. අමුත්තන් වෙන තැනක සහවන්නැයි ඇගේ සිත ඇට කීවේ ය. රෑ කෑමෙන් පැයකට පසු කහ පාට පොලිස් හෙලිකොප්ටරයක් කඳවුරට ඉහළ අහසේ හැසිරීම නිසා ඇගේ බිය වැඩි විය. තවත් පැයකට පසු ලෙෆ්ටිනන්ට්වරයෙකු, සාජන්ට් කෙනෙකු සහ බල්ලෙකු රැගත් පොලිස් වෑනයක් කඳවුරු භූමියට ඇතුළු විය.

fපිමා යළිත් අධ්‍යක්ෂ කුටියේ ජනේලය වෙතට ගොස් කන් දී ගෙන සිටියේ ය. පාර අයිනේ නිවසක ජීවත් වන මිනිහෙක් ද තමාට ටැලිෆෝන් කළ බව ලෙෆ්ටිනන්ට් වරයා අධ්‍යක්ෂකතුමා සමඟ කීවේ ය. ඔහුත් කොටියෙකු දැක ඇත. තුන් වෙනි පැමිණිල්ල ආවේ ගැහැනියකගෙනි. කොටියා තමා ගෙදර යන පාර අවහිර කළ බවත් තමා ඌට පෝකරයකින් තඩි බෑ බවත් ඇ කීවා ය.

ලෙෆ්ටිනන්ට් සහ අධ්‍යක්ෂකතුමා කුටියෙන් ගිය පසු ළමෝ බල්ලා සහ ඌ බාර ව සිටි මිනිහා වට කර ගත්හ. ලෙෆ්ටිනන්ට් ඔවුන්ගෙන් කඳවුර අවට සැක කටයුතු දෙයක් දුටු කෙනෙක් ඇද්දැයි විමසී ය. ඊට පසු ඔහු රෝසි සහ සෙටියනොව් සමඟ පෞද්ගලික ව කතා කෙළේ ය. නියම ලෙෆ්ටිනන්ට්වරයෙකුට නියම සාක්කියක් දෙන්නට ලැබීම නිසා මහත් ලෙස ආඩම්බර වූ ඔවුහු මොනරුන් මෙන් හිස් ඔසවා ගෙන පැත්තකට ගියහ.

"දැන් ඔයාට තේරෙනව නේ ද අපේ යාළුවන් එළිදරව් වෙන්න පුළුවන් බව ?" යුලියා fපිමාගෙන් ඇසුවා ය.

"එහෙම වෙන එක තමයි හොඳ ? එතකොට සෑම දෙයක් ම පැහැදිලි වෙවි" fපිමා කීවේ ය. යුලියා ඔහු දෙස නපුරු බැල්මක් හෙළුවා ය.

"අපි ඔවුන්ට උදව් කරන්න පොරොන්දු වුණා ද ? නැද්ද ?"

''ඔයා පොරොන්දු වුණා'' fපීමා කල්පනා නොකර කීවේ ය.

යුලියා අමනාපයෙන් ඔහු කෙරෙන් ඉවතට හැරුණා ය. එහෙත් එවිට ම පොලිස් ලෙfප්ටිනන්ට් තැන රෝසි සමඟ ඈ වෙත ආවේ ය. බැස යන හිරුගේ රැස් රෝසිගේ උපැස් විදුරු තුළ පිළිබිඹු වී තිබුණේ ය.

''ඔබ නේ ද පුරෝගාමී යුලියා ශ්‍රිබ්කෝවා ?'' ලෙfප්ටිනන්ට් තැන ඇසී ය. ''මේ සහෝදරයා කියනවා ඔබ කොටියාව දුටු බව සහ ඌ ඉන්න තැන ඔබ දන්න බව. එහෙත් කිසියම් හේතුවක් නිසා ඔබ එය කියන්නේ නැති ලු.''

යුලියා තමාගේ බැම එසෙව්වා ය.

''ඇයි ?'' ඈ ඇසුවා ය.

''හැබෑවට ම ඇයි ?'' ලෙfප්ටිනන්ට් තැන රෝසි වෙත හැරී ඇසුවේ ය.

''මොකක් හරි ඒ ගොල්ලන්ගෙ පලහිලව්වක්'' රෝසි කීවේ ය.

''මෙයාට සතුන් පිළිබඳ මානසික රෝගයක් තියනවා'' සෙමියනොව් එය ස්ථිර කෙළේ ය. ''මෙයා ඊයේ බළලෙක් සර්ඛන්ධයෙන් මට පහර දුන්නා. මාව අබ්බගාත කළා.''

''අබ්බගාත කළා ?'' කියමින් ලෙfප්ටිනන්ට් තැන ඔහු දෙස බැලුවේ ය. ඔහුගේ මුහුණේ සිරිම් කිපයක් සහ ඒවාට දැමූ කුඩා පැලැස්තරයක් මිස අංග විකලත්වයට පත් කිරීට පිළිබඳ ලකුණක් එත් නොවී ය.

''මොකද, ඔයා කියන්නෙ ඇට පිස්සු කියල ද ?'' fපීමා ඇසුවේ ය. ''මාත් ඉන්නෙ එයාගෙ පංතියෙ ම යි. මම කවදු වත් දැකල නෑ එයා කිඹුලෙක් එක්ක යාළුකම් පවත්වන බව.''

''ඒක හරි. ඔබේ උපකාරය ගැන ස්තුතියි'' ලෙfප්ටිනන්ට් fපීමාට කී ය. ''සාජන්ට් රෙක්ස් වත් අරන් අපි යමු'' ඔහු යළිත් රෝසි දෙසට හැරී ''ඔබ බය නැත් නම් ඔබට සුළුවනි ගිහිල්ල සතා හිටපු නියම තැන අපට පෙන්නන්න'' කී ය.

''මාත් ඌ දැක්කා'' සෙමියනොව් වහා කීවේ ය.

''නෑ. එක් කෙනෙක් ඇති'' ලෙfප්ටිනන්ට් කී ය. ''කැලේ ගමනට උදවිය අඩු වුණු තරමට හොඳයි.''

''ඒක හරි'' අධ්‍යක්ෂකතුමා එය අනුමත කෙළේ ය. ''ඒත් මාත් ඔබ එක්ක එනවා. මට බෑ මගේ පුරෝගාමියෙක් තනි ව ම යවන්න.''

ලෙfප්ටිනන්ට් එය අනුමත කරමින් හිස වැනී ය. ඔහු අධ්‍යක්ෂකතුමා තේරුම් ගත්තේ ය.

"මට කමක් නෑ මා වෙනුවට සෙමියනොව් ගියාට, එයා දන්නවා තැන මට වඩා හොඳට. මගේ කණ්ණාඩිත් නෑ" රෝසි නිහතමානී බවක් පෙන්වමින් කීවේ ය.

"බොහොම ස්තුතියි, ඔයා නියම මිත්‍රයෙක්" නිර්හීත එහෙත් මෝඩ සෙමියනොව් කීවේ ය. ඔහු සිතා සිටියේ රෝසි ගමනින් මහ හරින්නට බලන්නේ තමා වෙනුවෙන් බව ය.

රෝසි ආචාරශීලී ලෙස හිස නැමී ය. එහෙත් ඔහු මහ හැරීමේ නියම හේතුව දත් fපිමා හිකි හිකි ගා සිනා සුළෙ ය. එය ඇසුණ රෝසි fපිමා සහ යුලියා දෙස රවා බැලුවේ ය. යුලියාගේ පා දෙස බැලූ ඔහු සෙමින් එහෙත් ලෙfප්ටිනන්ට්ට පමණක් ඇසෙන ලෙසින් මෙසේ කී ය.

"මම ඔබට අවවාද කරනවා දූපතේ තියන පරණ මඩුවේ බලන්නට."

මොහොතක් නිහඬ ව සිටි ඔහු යළි නිකමට මෙන් මෙසේ කීවේ ය :

"දූපත වටේට බුරුල් මඩ වගයක් තියනවා මම කොටියගෙ අඩි සටහන් දැක්කා. ඒවයෙත් අර මඩ ම තිබුණා."

තමා ගහෙන් එන විට තමාගේ පාවල තැවරී තිබූ මඩ රෝසි නො අනුමානයෙන් දකින්න ඇතැයි සිතූ යුලියාගේ හදවත සැලුණෙය.

"අපි බලන්න ඕනෑ" ලෙfප්ටිනන්ට් කී ය. "අපි දන් ම යමු නැත් නම් ඉර බහින්න කලින් වෙලාව මදි වෙවි."

"දැන් කොහොම ද?" කරුණු තවත් අවුල් වුණු බව දුටු fපිමා, යුලියා ගෙන් රහසින් ඇසුවේ ය.

"අපි කොහොම හරි ඔවුන්ට දන්වන්න ඕනෑ" යුලියා කීවා ය. "ඔයා නවතින්න. මම යන්නම්. ස්ටෙපානිච් ගැන සෝදිසියෙන් ඉන්න. ඔයාට පේනව ද ඔහු සැම දෙනා වෙත ම ඇස් ගසා ගෙන ඉන්න හැටි ? කාටවත් ඔහුට නො දැනී ලිස්සා යන්ට බැරි විදිහට."

යුලියා කුස්සිය දෙසට ද එතැනින් වැටී කපොල්ල කරා ද දිව්වා ය.

එහෙත්, අහෝ ! ඈ රෝසි අඩුවෙන් තක්සේරු කර තිබුණි. ඈ පඳුරු අතරේ නො පෙනී යන්ට සැරසෙන විට ම ඇට කංඩායම් නායක රිටාගේ හඬ ඇසුණි.

"ග්‍රිබ්කෝවා ! යුලියා නවතිනු !"

ඈ ආපසු හැරුණා ය. රිටා ඈ දෙසට දුව ආවා ය. ඇට පිටුපසින් රෝසි සිනා සෙමින් සිටියේ ය.

යුලියා රීටාගේ ඇස් දෙස හරි කෙළින් බලා මෙසේ ඇසුවා ය.

''ඔයා වැඩුණ ගැහැනියක් වෙලත් කඳවුර අවට කොටි හැසිරෙනවයි කියන ආරංචිය ඔය තරම් තදින් විශ්වාස කරනවා නේ ද ?''

''ඒක කාරණයක් නෙමෙයි'' කියමින් ඈ පසු බැස්සා ය.

''ශ්‍රීබ්කෝවාට කොටියාට දන්වන්න ඕන වෙලා. මේක ඇතුළේ ලොකු කුමන්ත්‍රණයක් තියනවා'' රෝසි කීවේ ය.

''අනේ රෝසොව්, මොන පල් හැලි ද ඔයා කියන්නෙ ?'' කෝපයට පත් රීටා ඇසුවා ය. එහෙත් ඈ යුලියාගේ අතින් අල්ලා ගෙන ඇගේ කුටිය වෙතට එක්ක ගියා ය. මේ සිදුවීම් බලා ගෙන සිටි ස්ටෙපානිව් දූරිය සහ කංඩායම් නායිකාව අනතුරු සහිත පෙදෙසින් ඉවත් වී යන තුරු නො සෙල්වී සිටියා ය.

සියල්ලන්ගේ අවධානය යුලියා වෙත යොමු වී පවතින විට fපිමාට නිර්ණීත පවනිකාවක් රහ පාන්නට ඉඩ ලැබුණෙ ය. සෑම කෙනෙක් ම කුස්සිය දෙසට යොමු වී සිටින අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් ඔහු එතැනින් පිට වී වැට කරා දුව ගොස් කැළයට ඇතුළු විය. රෝසි පවා ඔනු පදුරු හොන්න අතරින් පලා යන බට නොදැන සිටියේ ය.

පැයකට පසු කඳවුරට පෙරළා ආ ඔහු වේදිකාව පිටුපස කපුළු එන්න ඔන්න මෙන්න කියා ඇති දෙමනස් මුහුණින් යුතු ව සිටි යුලියා වෙතට කිට්ටු කෙළේ ය.

''ඔක්කොම විනාසයි, මේ වගේ මොහොතක ඔයා ගිහින් හැංගෙනවා'' යුලියා ඔහුට දෙස් නැහුවා ය.

වෙන ඕනෑ ම වෙලාවක යුලියා තමා වෙත එල්ල කළ මේ බරපතල චෝදනාව ගැන fපිමා අමනාප වෙනු නොඅනුමාන ය. එහෙත් ඒ වේලාවේ ඔහු කොතෙක් දුරට වීරයෙකුගේ හැඟීමෙන් උඩ පි සිටියේ ද කිව හෙත් කැටපෝලියක් ගත් ළමයෙකුට නියම් දඩයක්කාරයෙක් සිනා සෙන්නාක් මෙන් සිනා සුනේ ය.

''මම එහාට ගියා'' ඔහු එහාට යන්න ආඩම්බරයෙන් සහ උස් හඬින් උච්චාරණය කෙළේ ය.

''කොහොම ද ? කොහොම ද ?, ඔයා ඒක කළේ ?''

''ඒක කව්රු හරි කළ යුතු ව තිබුණා.''

''ඉතින් මට ඒ ගැන සියලු දේ කියන්න, ඔවුන් අපේ අමුත්තන් ව ඇල්ලුව ද ?''

'' මම ඔවුන් ඔක්කෝට ම ඉස්සෙල්ල ගං ඉවුරට ගියා. එතකොට ඔවුන් සෙටියනොට් කොටියාව බය කළ තැන සොයමින් සිටියා. මම ඉවුරට ගිහිල්ලා අපේ යාළුවන්ට හැංගෙන්න හඬ නගා කියා සිටියා ''

'' ඉතින් ඒගොල්ලෝ මක් කළා ද ''

'' ඒ ගොල්ලෝ නිශ්ශබ්ද ව සිටියා ''

'' ඉතින් ඊට පස්සේ ? ඒගොල්ලට ඔයාව ඇහුණෙ නැත්තං ? ''

'' මට සහනිකයි ඇහුණ බව. මම කැගහමින් දුවන කොට ඇහුණ අර කට්ටිය බල්ලත් සමඟ එන බව. මම තවත් ඉහළට නැඟල ඔවුන්ව බැලුවා. ''

'' ඉතින් ? ''

'' ඔවුන් ගං ඉවුර පරීක්ෂා කළා. බල්ලා කලබල වෙලා වල්ගය දෙකකුල් අස්සේ සඟවා ගත්තා. බල්ලන්ට කථා කරන්න බැරි එක හොඳයි. ''

'' ඔව්, සමහර සතුන්ට කතා කරන්න බැරි එකත් හොඳයි. '' යුලියා අනුමත කළාය.

'' මම ගිතන්නෙ ඔවුන්ට සැක තිබුණා. ඒත් ඔරුව තිබුණෙ නෑ නේ''

'' ඉතින් ඔවුන් ආපහු ආවා ? ''

'' නෑ. ලෙප්ටිනන්ට හෙලිකොප්ටරය ගෙන්වා ගත්තා. ඔවුන් යනවා මම ඇඟින් ම දුටුවා. ටිනාඩි පහළෙහකට විතර පස්සේ හෙලිකොප්ටරය මඩුව ළඟට පාත් වුණා. මගේ පපුව පුපුරන්න ගැහුණා, මම කියන්නෙ. ''

'' ඉතින් මොකද වුණේ. ''

''දෙන්නෙක් හෙලිකොප්ටරයෙන් බැහැල මඩුවට ගියා. ඔවුන් ඉවතට ඇවිල්ල මඩුවෙ කිසි දෙයක් නැතැයි කියල කෑ ගැහුවා. එයින් පේන්නෙ අමුත්තන්ට මගේ දැන්වීම ඇඟිල තියෙන බවයි.''

යුලියා බැම හකුලා ගත්තා ය.

''ඔවුන් කොහාට ද, යන්න ඇත්තෙ ?''

''මම හිතනවා ඔවුන් මඩුවෙන් පිට වෙලා යන්න ඇති. හොයා ගනීවි කියල හිතා ගත කොහොට හරි යන්න ඇති. අපට ඉතින් නිස්කාන්සුවෙ නිදා ගන්න පුළුවන්'' fවිටා මද වේලාවක් කල්පනා කරමින් සිට මෙසේ ද කීවේ ය. ''හරි කනගාටුයි කෑට වත් මෙක කියන්න බැරි එක ගැන. කවුරු වත් අපව විශ්වාස කරන එකක් නෑ.''

වේදිකාවේ අනික් පැත්තේ කැලඹීමක් ඇති විය. බොහෝ දෙනා කතා කරනු ඇසුණි. යුලියා සහ fපිමා නැගිට ඉස්සි බැලූහ. සෝදිසියට ගිය කණ්ඩායම ඇවිත් බව පෙනුණි. ලෙfප්ටිනන්ට අවසානයට කියන දේ අසා ගැනීමට ඔවුහු කිට්ටුවට ගියහ.

"හෙට අපි පරීක්ෂණය නැවත පටන් ගන්නවා. ඒ අතර මම සියලු දෙනාට ම දන්වා සිටිනවා බොහෝම ප්‍රවේශමෙන් ඉන්න. සාජන්ට් සහ රෙක්ස් අපි අද මෙහි නවත්වා යනවා."

"අපි ඔවුන්ට රාත්‍රී කෑම දෙන්නම්" අධ්‍යක්ෂකතුමා කී ය. "මොකද ණං ඉවුරේ කොටියගෙ අඩි හෙම තිබුණ ද ?"

"නිසැකයෙන් ම" ලෙfප්ටිනන්ට උත්තර දුන්නේ ය.

යුලියා fපිමා දෙසට හැරී අධිෂ්ඨාන සහගත ව මෙසේ කීවා ය :

"සූදනම් වෙන්න."

"මොකවට ද ?"

"කඳවුරෙන් පැනල යන්න."

"පැනල යන්න ? ඇයි ?"

"ඔයාට පේන්නෙ නැද්ද ? ඔවුන්ට හැංගෙන්න සුදුසු කිසි තැනක් නෑ. කැළෑවක් නෑ. අපි ඉක්මනින් ඔවුන් වෙන දිහාවකට ගෙන යන්න ඕනෑ. අපි ඔවුන් මොස්කව් භූවරට ගෙනියනවා."

"යුලියා, ඔයා වේගෙ හැම පැත්තක් ම හොයා බලල නෑ. අපේ දෙමව්පියන් ගැන, කඳවුර ගැන, වෙනත් දේවල් ගැන ඔයා හිතුව ද ?"

"අපි මොස්කව් භූවර ඉඳල කඳවුරට fපෑන් කරනවා. එතකොට එයාලට කරදර වෙන්න ඕනෙ නෑ."

"මට බෑ. මම මේ ගැන මොනවත් කරන්නෙ නෑ" fපිමා කීවේ ය.

fපිමා කිසි සේත් බය ගුල්ඔලක් නො වේ. අනෙක් අතට ඔහු මේ දුන් කැළයට ගොස් ආවා පමණි. සාමාන්‍යයෙන් ගැහැනු උදවිය ඉක්මන් තීරණ ගැනීමෙහි දී පිරිමින්ට වඩා සමත් වෙති. එහෙත් පොදු විශ්වාසය එහි අනික් පැත්ත ය.

"පළමුවෙන් ඔයා රෑ කෑම මුකුත් ගන්න" යුලියා කීවා ය. "ඊට පස්සෙ ඔයාගෙ ජැකට්ටුව අරගෙන පැනල යන්න සූදනමින් සිටින්න. ඔයාගේ ඇඳ ඔයා නිදා ඉන්නා වගෙ පේන්න හදල තියන්න. ඊට පස්සෙ වැටේ කපොල්ල වෙතට එන්න. එහි දී අපි හමු වෙමු."

යුලියා මෙසේ කියා කැන්ටීමට ගොස් නිවිහැනේ කෑම කෑවා ය. fපීමා වික්ෂිප්ත ව සිටියේ ය. ඔහුට බඩගිනි නිබූ නමුත් කෑවේ ඉතා ටිකකි. එහෙත් යුලියා නම් බඩ පුරා කෑවා ය. ඈ මේසයෙන් නැඟිට, දීසි පිරිසිදු කර තබා, කිසි කෙනෙක් දිහා නොබලා කැන්ටීමෙන් පිට වුවා ය. රෝසිට පවා ඈ සිතා සිටි දේ ගැන හැඟීමක් පවා ඇති කර ගන්ට හැකි වූයේ නැත.

fපීමා සැන්දෑවේ ඉතිරි කොටස කඳවුරේ ඔබ මොබ සැරිසරමින් ගත කෙළේ ය. ඔහුට කීප වරක් රෝසි හමු වූ නමුත් හැකි තාක් දුරට ඔහුගෙන් මහ හැර සිටීමට උත්සාහ කෙළේ ය. ඔහු සිනමා හලට ගිය මුත් නිදිමත හැඳීගෙන එන බව දැනුණ නිසා දිට ම ගියේ ය. තමාට කඳවුරෙන් පිට ව යාමට හැකියාවක් නැතැයි වරක් ඔහුට සිතුණේ ය. පණ පිටින් සිටින එලොවියන් දුටු එක ම මිනිහා තමා නිසා තමා කොහොම හරි යා යුතු බව ද ඔහුට සිතුණේ ය. අවසානයේ දී දහයමාරට අධ්‍යක්ෂතුමා සංනාගාරයට ගොස් සුරෝගාමීන් හැම දෙනා ම නිදා සිටිද්දැයි පරීක්ෂා කළාට පසු fපීමා නැඟිට, ජැකට්ටුව හැඳ ගෙන, අම්මාගෙන් ලැබී වියදම් නොකර සාකකුවේ දමා ගෙන තිබුණු රූබල් තුන පිරික්සා බලා වැටේ කපොල්ල වෙත ගියේ ය. යුලියා ඔහු එන තුරු බලා සිටියා ය. ඈ ඔහුට මෙසේ කොදුලා ය :

"මම සහතිකෙන් දැන ගෙන හිටියා ඔයා එන බව."

07

මොස්කව් ගමන

අහසෙහි වැහි වලාකුළු රොක් වෙමින් තිබිණි. වායුව වඩ වඩා තෙත් ගුණයෙන් යුතු විය. වනයෙහි පුසුඹ තියුණු සහ කටුක විය. රෑ අඳුර නිසා කැලය දවාලට වඩා ගන ව සහ මහත් ව දිස් විය. ඔවුහු ගහක නො හැපෙන්නට, මුලක නො පැටලෙන්නට පරෙස්සම් වෙමින් ඉදිරියට ගියහ.

ඔවුන් ගහට ළඟා වන විටත් සඳ බැබළෙමින් තිබුණි. එහෙත් වලාකුළු සඳට ඉතා කිට්ටුවෙන් – ඇතැම් විට සඳ වුවා කරමින් පා විය.

"හී ! හී !" ගං තෙරට පැමිණි වහා ම යුලියා හඬ නැඟුවා ය. "මේ මමයි. පිටතට එන්න."

"ඔයා හිතන්නෙ ඔවුන් පොලිසියෙ මිනිසුන්ගෙන් බේරෙන්න පාතාල ලෝකයේ හැංගෙන්න ඇති කියල ද ?"

"අපට පීනලා යන්නයි වෙන්නෙ" යුලියා කීවා ය. ඈ සිය පා වහන් ඉවතට ගසා දමා ජලය පිරික්සා බැලුවා ය. එය කුණාටු සහිත වැස්සකට පෙර ජලය මෙන් උණුසුම් ය.

හදිසියෙන් ම යුලියාට හබල් ගාන හඬක් ඇසුණි. ඈ ගහ උඩහ පරීක්ෂාවෙන් බැලුවා ය.

සඳ රැස් කලඹක් ඔරුවක සේයාවක් මතු කෙළේ ය. සපුරා දරණ ලා ගත් දුවැන්ත පිඹුරා ඔරුවේ ඉස්සරහ කොනේ වාඩි වී සිටියේ ය. පසු කොනේ නියම තොටියෙකු මෙන් වාඩි ගත් කොටියා ඔරුව පැද්දේ ය. ඔහු නියම තොටියෙකු නො වන බව යුලියා දත් නමුත් – එලොවියන් නැවත දකින්නට ඈ දැඩි ආශාවෙන් සිටි නමුත් – ඇට මේ දර්ශනය නිසා ඇති වූ තද බල දිග සිනාව නවත්වා ගන්නට බැරි විය.

ට්‍රැන්ක්වේරි – ට්‍රැන්කෝවේරි ඔරුවේ ඇණිය ගං ඉවුරේ හැප්පුවේ ය. පිඹුරා ප්‍රීතියෙන් උගේ තුන් කොන් නිස වනා ආවාර කෙළේ ය.

"අපි ඔයාල දැකීමේ ආසාව අත් හැරලයි හිටියෙ" පිඹුරා කීවේ ය.

"අපිත් එහෙමයි" fපිමා උත්තර දුන්නේ ය.

"ඔයාලට හොඳින් හැංගෙන්න පුළුවන්කම තිබුණ ද ?" යුලියා ඇසුවා ය.

"අපේ මේ මිත්‍රයාට පිං සිදු වෙන්න" පිඹුරා fපිමා දක්වමින් උත්තර දුන්නේ ය. "ඔහුගේ හඬ ගැම අප පරීක්ෂා කළා. දුපත හිර ගෙයක් තරම් හොඳ වුවත් අපි ඔරුව පැද ගෙන ගිහිල්ලා අනික් ඉවුරේ හැංගුණා."

"ඔව්" ඇඟන්තුකයන් බේරා ගැනීමට සමත් වූ එක ම තැනැත්තා තමා නිසා ආඩම්බරයෙන් සිටි fපිමා කීවේ ය. "ඔයාල කුහුඹුවො හරි වැලි මීයො හරි වගේ ගහෙන් එගොඩ වෙන්න ඇති."

"ඒ වගේ ම අපව කන්නත් ඉඩ තිබුණා. කන්න කැමති ඕන ම කෙනෙකුට" කොටියා මිමුණුවේ ය.

"fපිමා පළමුවෙන් කොටියව එහා ගොඩෙන් බස්සලා එන්න" යුලියා කීවා ය. "එතකං අපි ඒ දිහා උනන්දුවෙන් බලා ඉන්නං."

"හොඳයි, හොඳයි. කපිතාන්තුමී" ඉතින් කඳවුරට ආපසු යාමක් සිදු නො වන බව තේරුම් ගත් fපිමා කීවේ ය.

fපිමා කොටියා නංවා ගෙන ඔරුව පැද ගෙන ගිය පසු යුලියා පිඹුරා දෙසට හැරුණා ය. "ඔයාල මොස්කව් නගරයට එක් කර ගෙන යන්න අපි කඳවුරෙන් පැනල ආවා."

"අපි ඔය දෙදෙනාට කෘතඥ වෙනවා" පිඹුරා ඇට කී ය. "ඔය දෙන්නා අප දැන සිටියේ යන්තමින් ඒත් අපට මෙතරම් හිතවත් බවක් පෙන්නුවා. ඔයාට මා කියන දේ තේරෙනවා ද ?"

"ඕ, ඒවා අමතක කරන්න. මෙන්න fපිමා එනවා. ඉක්මන් කරන්න."

ඔවුහු ඔරුව අනික් ඉවුරේ දී අත් හැර දමා පටු පාර දිගේ මහා මාර්ගය දක්වා ගමන් කළහ. දැන් බොහොම රෑ වී ඇත. ඇත වංගුවෙන් මතු වී ආ දීප්තිමත් ඉදිරි ලාම්පුව සහිත මොටෝ රථ කිපයක් වේගයෙන් ඔවුන් පසු කර ගියහ. කොටියා සීතලේ වෙව්ලුවේ ය. තියුණු සුළඟක් හමා ගියේ ය.

"අපි ලොරියක් නවත්තමු" යුලියා කීවා ය.

''හොඳයි, ලාඩාවක් (එනම් මොටෝ රියක්) වැඩිය හොඳයි'' fපිමා ඇනුම් පදයක් ලෙසින් මිමිණුවේ ය.

පොද වැස්සක් පටන් ගත්තේ ය.

''අපි ඔය දෙන්න ගැනයි විශ්වාසය තබන්නෙ'' තත්ත්වය සහතික කර ගන්නට මෙන් දිඹුරා කීවේ ය.

''අපට නැති වෙන්න දෙයක් නෑ'' කොටියා සරදමට මෙන් කීවේ ය. ඉදිරි ලාම්පුවක එළිය වැටී අඳුනා ගැනීමෙන් වළකිනු පිණිස ඔහු අගලට බැස වාඩි වී සිටියෝ ය.

නගරය පැත්තට යන වාහනයක් දුටු යුලියා අත එසෙව්වා ය. fපිමා ඇගේ පසෙකින් මඳක් පස්සට වී සිටියේ ය. ඔවුහු වාසනාවන්තයෝ ය. ලොරියේ පසු පස ලොකු හිස් වගැනයකි. රියැදුරා ඔවුන් මොස්කව්වලට ගෙන යාමට එකඟ විය. යුලියාට තමා සමඟ ඉස්සරහ කැබ් එකේ යන්ටත් සෙස්සන්ට පිටුපස වැනයේ යන්ටත් ඉඩ දීමට ඔහු කැමති විය. ඔහු කැබ් එකෙන් බැස පරීක්ෂා කරන්නට වත් කරදර වූයේ නැත. fපිමා සහ සත්තු කීල් රෙද්දක් යට සුව පහසු ලෙස තැන්පත් වූහ. මොස්කව්වලට යන තුරු ම සින්දු කිව් රියැදුරා ඔවුන් ගෙදරට ම ගෙන ගියේ ය. ඔහු ඔවුන්ගෙන් මුදලක් ගැනීම පවා ප්‍රතික්ෂේප කෙළේ ය. සමහරු බොහෝ වාසනාවන්තයෝ ය.

08

මම තනියම නොවෙයි

ලොරිය යුලියා විසූ තට්ටු නිවාසයේ මිදුලට යන පාරේ ආරුක්කුව ළඟ නවත්වන ලදී. එහෙත් යුලියා ඉන් බැසීමට ඉක්මන් නුවූවා ය. fපිමා සහ සතුන් බැස වාහනය හිස් වූ බව දැනෙන තුරු ම ඕ රියැදුරාට ප්‍රශංසා කරමින් වාහනය තුළ වැඩි වේලාවක් රැඳී සිටියා ය.

fපිමා ගෙතුළට දිව්වා ය. ඔහුට ඕනෑ කෙළේ මෙයින් නිදහසක් ලැබ නිදා ගන්නට ය. එහෙත් යුලියා ආත්තම්මා මුණ ගැසීමේ දී මුහුණ පාන්නට විය හැකි බාධකවලට මුහුණ දෙන්නට සූදානම් වෙමින් සිටියා ය.

ඈ තට්ටු නිවාසයේ දෙවෙනි මහලට නැංගා ය. බාරදූර මොහොත ළඟා වෙමින් තිබෙන බව දත් සත්තු ද බයාදු ලෙසින් එයට ඇදුණාහ. අවස්ථාවේ අවිනිශ්චිත භාවය නිසා ඔවුහු කණස්සල්ලෙන් සිටියාහ. අමුත්තන්ට සැඟවී සිටීමට සන් කරමින් යුලියා දෙරේ සීනුව එබුවා ය.

ආත්තම්මා ඇවිත් දොර ඇරීමට සෑහෙන වේලාවක් ගත විය.

"යුලිය, ඔයා මොකද මේ මහ රෑ ? ඔයා අනිද්ද වන තුරු නේන්න නේද හිටියෙ ?"

"ආත්තම්මා, කලබල නොවී පොඩ්ඩක් ඉන්න. මම තනියම නෙමෙයි. මගේ යාළුවොත් මා එක්ක ඇවිත් ඉන්නවා. ඔවුන්ට මෙහෙ නවතින්න ඕනෑ. බය වෙන්න විතරක් එපා. තරහ වෙන්නත් එපා."

"මාව බය කරන්න ටිකක් අමාරු වෙයි" ආත්තම්මා උත්තර දුන්නා ය. "කෝ ඔයාගේ යාළුවෝ ? ඔයා කඳවුරෙන් පැනල ආව ද? නැත් නම් මොකද මේ අවේලාවේ ?"

"එන්න ඇතුළට" යුලියා අමුත්තන් ගෙතුළට කැඳෙව්වා ය.

පළමුවෙන් ඇතුළු වූයේ කොටියා ය. දෙරකඩ නැවතුණ ඔහු ආත්තම්මාට හිස නමා ආචාර කර මෙසේ කීවේ ය :

"සුබ සැන්දෑවක් වේවා. අවසර නැති ව ඇතුළු වීම ගැන කරුණාකර සමා වෙන්න."

ආත්තම්මා සුදුමැලි වූවා ය. ඈ සිටියේ හැරමිටි වාරුවෙනි. ඒ පසුගිය ශීත සෘතුවේ දී බිඳුණු ඇගේ දණ හිස තව මත් හරි හැටි පැස්සී නැති නිසා ය. ඈ කොටියා පලවා හරින්නට මෙන් හැරමිටිය එසෙව්වා ය. කොටියාගේ වලිගය උඩුකුරු විය. ඔහු අඬියක් පස්සට ගෙන දුක්මුසු හඬින් මෙසේ කීවේ ය :

"හැම තැන ම එකයි. වරක් පෝකරයක්, දැන් හැරමිටියක්."

යුලියා හනික මෙසේ කීවා ය :

"ආත්තම්මේ, ට්‍රැන්ක්වේරි – ට්‍රැන්කෝවේරි පේන හැටියේ කෙනෙක් නෙමෙයි. එයා කොටියෙක් වගේ පේනවා විතරයි. එයා වෙනත් ග්‍රහ ලෝකයක සිට පොළොවට පියාඹා ආපු පිට සක්වළ වැසියෙක්."

"හැබෑවට ම ?" ආත්තම්මා මඳක් කලබලයෙන් සහ වෙවුලන ස්වරයෙන් ඇසුවා ය. "ඉතින් ඔයා ඔහු ගෙදර එක්කර ගෙන ආව ද ?"

"ඔව්, ඔව්. ඔයා අපට උදව් කරන්න ඕනෑ. ඇයි, නැත්තං කොහෙද කොටියෙක් වගේ පේන කෙනෙක් හංගන්න පුළුවන් ? හැම පැත්තෙන් ම ඔහුට හැරමිටි පාර දෙන කොට."

"යුලියා, මම කාට වත් පහර දෙන්නෙ නෑ" ආත්තම්මා කීවා ය. "ඒත් අද ඔයා කොටියෙක් ගෙදර ගෙනාව නම් නො වැරදීම හෙට ගේන්නෙ දැවැන්ත සර්පයෙක් වෙන්න පුළුවනි."

පිඹුරා ඔවුන් හමුවට ඇදුණේ ය. ඒත් ඔහුට යුලියාගේ ආත්තම්මා ක්ලාන්ත වීමෙන් වළක්වන්නට බලවත් උත්සාහයක් ගන්නට සිදු විය.

"ඔබේ මහාත්ම භාවයේ පිහිට සොයා එන්නට අපට බල කෙළේ අපේ දැඩි අවශ්‍යතාව යි. මම ඇවිත් තත්ත්වය පැහැදිලි කර දෙන්න ද ?"

"ඔව්, කරුණාකර පැහැදිලි කරන්න. මුල සිට ම පටන් ගන්න."

ඔහු සියල්ල කීවේ ය. ඉන් සැහීමට පත් ආත්තම්මා ටැලිෆ්පිත්නය ගෙන යුලියා සහ f්පිමා ගෙදර ආ බව ද ඔවුන් දෙදෙනා ගැන කලබල නො වන ලෙස ද කඳවුරට දන්වා යුලියාට තේ ලැස්ති කරන්නට කීවා ය. යුලියාගේ දෙමාපියන්ගේ කාමරය අමුත්තන්ට නිදා ගැනීමට පිළියෙල කරන ලදි. ඔවුහු ආත්තම්මාගේ පසුගිය කාලය පිළිබඳ කතන්දර ඉත සිතින් අසා සිටියහ.

පිඹුරා යුලියාට රහසින් මෙසේ කීවේ ය :

''ඔයාගේ ආත්තම්මා විශ්ව සහෝදරත්වයේ විශිෂ්ට නියෝජිතයෙක්. ඒ වුණත් මට කොහොම වත් හිතා ගන්න බෑ අපි ඉන්දියාවට යන්නෙ කොහොම ද කියා.''

''ආත්තම්මා ජීවිතයේ බොහොම අත්දැකීම් තියන කෙනෙක්. උන්දැ මේ ගැන යම්කිසි උපක්‍රමයක් කල්පනා කරාවි'' යුලියා කීවා ය.

09

ආත්තම්මාගේ ගණුදෙවි නුවණ

පසු දා උදේ යුලියා බොහෝ වේලාවක් නිදා ගත්තා ය. ඇඳෙන් නැගිටට වහා ම ඇට ඇති වුණ සිතිවිල්ල නම් තමාට එදා උදේ ව්‍යායාම ගන්නට බැරි වූ වග යි. ඉන් පසු ඇට ඉදිරි පස බිත්තියේ තිබෙන පුරුදු පින්තූරය ඇස ගැසුණු විට සිදුවීම් සියල්ල ඇගේ සිතට ගලා ආවේ ය. ඈ තදින් කන් දුන්නා ය. ආත්තම්මාගේ කාමරයෙන් සිහින් කට හඬවල් ඇසුණේ ය. ඈ ශබ්ද නො නහා ඇඟිලි තුඩුවලින් ඇවිදිමින් දොර ළඟට ගොස් එබී බැලුවා ය. කාමරය තුළ විස්මය ජනක දේ සිදු වෙමින් තිබුණේ ය. පිඹුරා සිය පැතලි හිස ආත්තම්මා දෙසට කිටටු කර තමාගේ බඹින් කිසිවක් මුමුණමින් සිටි අතර කොටියා ඇගේ වේදනා සහගත දණහිස තමාගේ මහත් අත් පහුරුවලින් පිරිමදිමින් සිටියේ ය.

යුලියා දුටු ආත්තම්මා මෙසේ කීවා ය :

''කනගාටු වෙන්න එපා. තවත් වෛද්‍ය උපදේශ ලබා ගැනීමක් වරදින්න බෑ. ඔයා දන්නවා අපේ බහු සායනය ගැන මගේ විශ්වාසය නැති වෙලා බව. ඔයා ගිහින් උදේ කෑම ලෑස්ති කරන්න.''

යුලියා කේතලය ලිප තබා වහා ම ආපසු කාමරයට ආවා ය. වෙනත් ග්‍රහ ලෝකයකින් ආ සතුන් තම නිවසෙහි විසීමේ අදහසට මේ තරම් ඉක්මනින් ඈ පුරුදු වීම විස්මය ජනක ය. යුලියා සිය ආත්තම්මා අඬුවෙන් තක්සේරු කර ඇත.

''මට සහතිකයි මේ ශක්ති වර්ධන ආලේපය ඔබට අගුණයක් ඇති නො කරන බව'' කොටියා කීවේ ය. ''ඔබේ විරුද්ධත්වයක් නැත් නම්...''

''ඔබ මොකද මේ ගැන කියන්නෙ ?'' යුලියා පිඹුරාගෙන් ඇසුවා ය.

"ඒක බොහොම සුළු දෙයක්" පිඹුරා පැහැදිලි කෙළේ ය. "පෘථිවියට ඔබින ලෙස අපේ සිරුරු නැවත හැඩ ගස්වද්දී අපට වෛද්‍ය මෙවලම් බැගයක් දුන්නා. අපි මෙහි ආ පසු ව මොන දෙයක් වුවත් සිදු වෙන්න පුළුවන්. බැගයේ අඩංගු ද්‍රව්‍ය විශේෂයෙන් පොළෝ වාසීන්ට සුදුසු ලෙස සකස් කළ ඒවා. පිළිස්සුම්වලට කැඩුම්-බිඳුම්වලට සහ ඉදිමුම්වලට සුදුසු ලෙස සකස් කළ බෙහෙත් වර්ගත් ඒ අතර තිබුණා. අපේ මිත්‍ර ට්‍රැන්ක්වේරි – ට්‍රැන්කෝවේරි ඔබේ මිත්තණිය වන මාරියා මිතීයිලොව්නා පරික්ෂා කර බලා තීරණය කළා ඇට අපේ බෙහෙත් අගුණ නැති බව."

කොටියා ලෝහ ගාංචුවකින් (zip) විවෘත කළ හැකි, කැන්ගරුවන්ගේ මල්ල වැනි ඔලොගුවක් පෙන්වීමට බඩතුරට අත යැවිවේ ය. ඔහු එය තුළින් ටියුබයක් එළියට ගත්තේ ය. එය මිරිකන විට පිට වූ කහ පාට ආලේපයකින් ඇබිත්තක් අත් පසුපේ පැතලි කොට්ටයට දමා ගත් කොටියා ඉන් ආත්තම්මාගේ දණ හිස පිරිමදින්නට විය.

"උණුයි !" ආත්තම්මා කීවා ය.

"එහෙනම් හොඳයි" පිඹුරා කීවේ ය. කොටියා පිරිමැදීම නිම කර අත සෝදා ගැනීමට නාන කාමරයට ගියේ මුළු ජීවිත කාලය ම ශ්‍රීබකෝවා නිවසෙහි ජීවත් වූවෙකු පරිද්දෙනි.

"යුලියා, මට ඔය ටැලිෆෝන්යයි ඩිරෙක්ටරියයි මෙහාට දෙන්න" ආත්තම්මා කීවා ය.

යුලියා ඒවා ගෙනැත් දුන්නා ය. ඒ සමඟ ආත්තම්මාගේ කණ්ණාඩි කුට්ටමත් ගෙනැත් දීමට ඇ අමතක කෙළේ නැත.

"බොහොම ස්තුතියි" ආත්තම්මා කීවා ය. "මම මේ ගැන කීප දෙනෙකුට ෆෝන් කරන්න යනවා. ඔයා පෙට්ටියේ තියෙන සල්ලිත් අරන් කඩේ ගිහින් කිරි ලීටර් හතරකුයි බිත්තර දුසිම් පහකුයි පාන් ගෙඩි අටකුයි ගේන්න... ඔයා දන්නවා දැන් අපි විතරක් නොවෙයි ගෙදර ඉන්නෙ. අපට අමුත්තෝ ඉන්නවා. මම උදේ ඔවුන් සමඟ සතුටු වන ආකාරය ගැන සිතමින් සිටියා. ඔවුන්ට ආහාර අවශ්‍ය නැතුවා වෙන්න පුළුවන්. ඒත් අපි ඔවුන්ට සංග්‍රහ කරන්න ඕනෑ. දැන් යන්න."

යුලියා වෙළඳ සැලට ගොස්, බරට බරේ සාප්පු මල්ලක් රැගෙන එන විට ඇට fපිමා මුණ ගැසුණේ ය. යුලියාගේ ආත්තම්මා එලොවියන් කෙරෙහි මොන අන්දමට ක්‍රියා කරනු ඇද්දැයි නොදන්නා නිසා තට්ටු නිවාසයට යන්නට පසුබට වූ ඔහු පාරට බැස ඔබ මොබ ඇවිදිමින් සිටියේ ය. ඔහු යුලියාට බඩු මල්ල උඩට ගෙන යාමට උදව් කෙළේ ය.

ආත්තම්මා පළමු තැන ම උන්නා ය. යුලියා ඇට කෝපි කෝප්පයක් ගෙනවුත් දී මෙසේ ඇසුවා ය :

"ඔයා යමක් ගැන හිතුව ද ?"

"මම හිතුවා විතරක් නෙමෙයි, ඒ අනුව වැඩත් කරනවා" ආත්තම්මා කිව්වා ය.

ටැලිෆෝනය නාද විය. ඈ රිසීවරය ගත්තා ය.

"කොල්යා, ඒ ඔයා ද ? ඉතින් ? ඔයා කියන්නෙ යස්නොව්ලා ද ? මොස්කව්වල ? ඒක අගෙයි. මට තාම යන්ට බෑ. ඒත් මම යුලියා යවන්නම්. ඔව්, ඇත්තෙන් ම මම කියල යවන්නම් ඒ මොකට ද කියල."

ආත්තම්මා රිසිවරය තිබ්බා ය.

"ඒ සත්ත්වෝද්‍යානය ද ?" යුලියා ඇසුවා ය.

"ඔයාට සත්ත්වෝද්‍යානයෙන් ඉන්දියාවට ටිකට් ගන්න බෑ" ආත්තම්මා ඇනුම් පදයක් ලෙසින් කීවා ය. මම ෆෝන් කළේ සර්කසයට. දැන් ඔයා හොඳින් අහගන්න. ඔයාගෙ ජීවිතේ එක් වරක් වත් වැඩිහිටියන් කියන දේ ඒ හැටියට ම කිරීමට උත්සාහ කරන්න. දැන් ස්වෙත්නොයි මාවතට යන්න. එහෙ දි ඔයාට හමු වේවි යස්නොව් නම කියන සතුන් පුහුණු කරන පවුලේ උදවිය. දැන් මේ මොහොතේ ඔවුන් පෙර දැක්ම (rehearsal) පවත්වනවා."

ආත්තම්මා ඇගේ සාජන්ට් – මේජර් කට හඬින් කතා කළා ය. ඈ ඒ කට හඬ පාවිච්චි කරන්නේ කලාතුරකිනි. යුද්ධ කාලයේ ඈ රේඩියෝ යන්ත්‍ර ක්‍රියා කරවන්නියක වශයෙන් යුද බිමේ සේවය කළා ය. ඈ වරක් පැරවුටයක් රැගෙන පැනීම පවා කර ඇත.

"පෙරදැක්ම ? සර්කසයේ ? මම ඒක හිතුවා. ඊයේ රෑ මම ඒ ගැන හිත හිතා උන්නා. මම මගෙන් ම ඇහුවා කොටි ගන්නෙ කොහෙ ද කියා. ඇත්තෙන් ම සර්කසයෙ තමයි" fපිමා කීවේ ය.

"ඉතින් මොකද ?" තව ම මේ ගැන කිසි තේරුමක් නැති යුලියා ඇසුවා ය.

"අපි අපේ අමුත්තන් සර්කසයට බාර දෙනවා" ආත්තම්මා කීවා ය. "ඔවුන් පුහුණු වූ සතුන් හැටියට ක්‍රියා කරමින් කරදරයක් නැති ව ජීවත් වේවි. මා හිතනව සියල්ල හරියට සිදු වේවි කියා. ඒත් වැඩි වගකීම රඳා හිටින්නෙ අප පිටයි."

ආන්තම්මා යුලියාගේ බුද්ධිමත් බවට සහ උපායශීලී බවට ගරු කළා ය. ඇට ඒකාන්තයෙන් අවශ්‍ය උපදෙස් පමණක් දීමට ඈ බොහෝ පරෙස්සම් වූවා ය. එහෙයින් පැය බාගයකට පසුව යුලියා සහ fපිමා පරණ සර්කසය තුළ වූහ. fපිමා ගුර කාරයෙකු නැති පස්සා දෙරටුව සොයා ගත්තේ ය. ඔවුහු වහා ම සර්කස් ගඳ සහිත ගොඩනැඟිල්ලට ඇතුළු වූහ. කම්කරුවන් ටික දෙනෙක් ලෝහමය වැටත් සවි කිරීම සඳහා ඔසවා ගෙන එද්දී අපූරු පෙනුමක් ඇති උදේ වැඩ කරන කංඩායම වෙත ඔවුහු ළඟා වූහ. fපිමා එක් කම්කරුවෙකුට කිට්ටු කර මෙසේ ඇසුවේ ය :

''යස්නොව්ලා වැඩ කරන්නෙ මෙහෙ ද ?''

නාඳුනන ළමයෙකු වේදිකාව පිටුපස සිටීම ගැන මඳකුදු පුදුමයට පත් නුවූ කම්කරුවා මෙසේ උත්තර දුන්නේ ය :

''අපි මේව ගෙනියන්නෙ ඒ ගොල්ලට තමයි.''

පසු පස ආසන පේළි මුළුමනින් අන්ධකාරයේ ය. යුලියා සහ fපිමා ඒවාට නැඟ සතුන් පුහුණු කරන්නන්ගේ පෙර දැක්ම නැරඹූහ.

පළමුවෙන් කවයට ඇතුළු වූයේ ක්‍රීඩා ඇදුම් කට්ටලයක් ඇඳගත් මැදි වියේ මිනිහෙකි. ඔහු සංඥා දුන් කල සත්තු කොටු කරන ලද පාරෙන් ඉක්මන් ගමනින් ඇතුළු වූහ. fපිමා සතුන් ගැන්නේ ය.

''සිංහයො හතර දෙනයි. ඒක එච්චර වැඩි ගාණක් නෙමෙයි... අහ ! කොටියෙකුයි, අඳුන් දිවියෙකුයි...'' සතුන් අලස බවින් යුතු ව පාදම් (pedestals) පිට නැඟී සිටින රවුම් කුඩුවට වටකුරු මුහුණත් සහ මුක්කන් නාසයක් ඇති තරුණියක් ගොස් ඔවුන්ට කතා කළා ය.

''ඔයා දන්නව ද ? නියම රහ දැක්වීමකටත් වැඩිය මේ භයානකයි'' යුලියා සෙමින් fපිමා සමඟ කීවා ය.

''බය වෙන්න ඕනෙ නෑ'' පිටුපසින් හඬක් ඇසුණි.

යුලියා කැරකී ආපසු බැලුවා ය. ඇට පිටුපස ආසන පේළියේ සිංහයන් හීලෑ කරන්නියගේ මුහුණ වැනි රවුම් මුහුණක් සහ මුක්කන් නාසයක් ඇති අවුරුදු දෙළහක පමණ පිරිමි ළමයෙක් වාඩි වී සිටියේ ය

''ඇයි'' යුලියා විපරම් බැල්මකින් යුතු ව ඇසුවා ය.

''විරා සතුන්ට පුරුදු යි. එයාට සත් වෙනි ඉන්ද්‍රියයක් තියෙනව ලු. සුදුසු කාලය ආවා ම සතුන් පුහුණු කිරීම එයාට ම බාර දෙන්න තාත්තා තීරණය කරලා තියනවා.''

''ඔයාගෙ නම යස්නොව් ද ?'' යුලියා ඇසුවා ය.

''ඒක හරි. ඒත් ඔය ගොල්ලො මොකද මෙහෙ කරන්නෙ ? ඔයාල ඩිරෙක්ටර්ගෙ යාලුවොද ?''

''කොහෙත් ම නෑ'' fපීමා බලෙන් පැන උත්තර දුන්නේ ය. ''අපට කොටියෙක් ඉන්නවා. ඌ සර්කසයට බාර දෙන්න අපට ඕනෑ කරනවා.''

''කට වහ ගන්නවා'' යූලියා නො ඉවසිල්ලෙන් කීවා ය. එහෙත් එවිටත් හැනිය සිදු කර ඉවර ය.

''කොටියෙක් ?'' පුංචි යස්නොව් සිනා සුණේ ය.

''කොහෙද ? ඔයාගෙ සාක්කුවේ ද ? බොරුකරයා.''

''මම කියන්නෙ බොරු නෙමෙයි'' fපීමා කැගැසුවේ ය.

වැඩිමහලු යස්නොව් (ළමා යස්නොවිගේ පියා) ජලය ඉසින රබර් නළයක් ද ඇතිව පිට පැත්තේ සිටි සහකාරයෙකු අමතා මෙසේ කීවේ ය :

''වැලේරි ළමයින් පිටතට යවන්න. සත්තු කලබල වෙනවා.'' යූලියා ඉකි ගැසෙන කරම් දුකින් fපීමාට දෙස් පැවරුවා ය. වැලේරි, යූලියා සහ fපීමා දෙරටුවෙන් පිටතට යැව්වේ ය. එහෙත් fපීමා නො නවත්වා ම මැසිවිලි කීවේ ය.

''එයයි ඒක පටන් ගත්තෙ ! එයා මාව කේන්ති ගැන්නුවා.''

''ඔයා දන්නෙ මොනව ද ?'' යූලියා කීවා ය. ''ගිහින් කෑමට මුකුත් ගන්න. නැත් නම් වෙන දෙයක් කරන්න. මට ඔයා ජේන්න ඕනෙ නෑ. අපි මෙහාට ආපු කාරණාවට වඩා ඔයාට ඔයාගෙ හැඟීම් ලොකුයි ''

''මම එයාට කිව්වෙ ඇත්ත. මට ඕන කළා එයාට අපේ කොටිය දෙන්න...''

''මගෙ ඇහැට නො පෙනී යන්න'' යූලියා නැවතත් කීවා ය. ඈ පාරේ අනෙක් පැත්තට ගියා ය. ඔස හරවා ආපසු බැලූ ඈ fපීමා යමක් කල්පනා කරමින් සිටින බව දුටුවා ය. ඔහු තමාගේ සාක්කුවේ තිබුණ පොඩි වෙව්ව රුබල් තුනේ නෝට්ටුව ගෙන යූලියා කී හැටියට කරන්නට කල්පනා කෙළේ ය. ඔහු නො පෙනී ගිය පසු යූලියා ආපසු සර්කසයට ගියේ ය

ඇට බොහෝ වේලා-පැය දෙකකටත් වැඩි ය- බලා සිටින්නට සිදු විය. එහෙත් ඈ සිත දැඩි කර ගත්තා ය. අන්තිමේ දී කණිෂ්ඨ යස්නොව් පසුපස දෙරටුවෙන් පිටතට ආවේ ය. මාවතේ අයිස්ක්‍රීම් හලේ දී යූලියා ඔහු අල්ලා ගත්තා ය. එහෙත් ඈ ඔහු අයිස් ක්‍රීමයක් මිලට ගෙන බංකුවකට ගොස් වාඩි වී පා දෙපසට විදහා දැවටුම ඉවත් කරන තුරු පමා වූවා ය.

"යස්නොව්, මගේ යාළුවා ගැන කලබල වෙන්න එපා. එයා කීවෙ ඇත්ත. ඒත් එයා ඒක මෝඩ විදිහටයි ඉදිරිපත් කළේ."

"හලෝ !" කණිෂ්ඨ යස්නොව් පුදුමයෙන් කී ය. "මේක අලුත් ම විධියේ දෙයක් ! ඉතින්, මොකද ඔයගොල්ල මා පස්සෙ එන්නෙ ?"

"මට ඔයා එක්ක බරපතල පාකච්ඡාවක් කරන්න තියනවා."

"අපූරුයි, එහෙනම් කියන්න."

"ඔයා විද්‍යා ප්‍රබන්ධවලට කැමති ද ?"

"ඔව්. ඉක්මනින් කියන්න. මට පෙර දැක්මට යන්න තියනවා."

යුලියා අනාගත පුහුණුකරුට කතාව මුළුමනින් කීවා ය. පුහුණුකරු එය විශ්වාස කරන්නට තීරණය කෙළේ ය. මක් නිසා ද ; සියල්ල සිත් ගන්නා බව ඔහුට පෙනී ගිය හෙයිනි. පැයකට පසු ඔවුහු යුලියාගේ තට්ටු නිවාසයෙහි පෙනී සිටියහ.

කොටියා විසින් දෙර හරින ලදී. ඔහුට පිටුපසින් ඇගේ පුරුදු හැරමිටිය නැතිව, එහෙත් අත් දෙකේ පිහන් දෙකක් ඇතිව ආත්තම්මා සිටියා ය. අමුත්තා දැකීමෙන් කිසි සේත් පුදුමයට පත් නොවූ ඇ මෙසේ කීවා ය :

"මිනිස්සු නිතර ම (පිහන්) සේදිල්ල අන් හැර දානවා."

යස්නොව්ට තට්ටු නිවාසයට ඇතුළු වන්නට බැරි විය. ඔහු කොටියා දෙස ඇස් ඔරවා බලා ගෙන සිටියේ ය. කොටියා ද යස්නොව් දෙස ඇස් ඔරවා බලා සිටියේ ය. මේ අතර යුලියා ආත්තම්මා දෙස ඇස් ඔරවා බලා සිටියා ය. පළමුවෙන් කට ඇරියේ යුලියා ය.

"කෝ ඔයාගෙ හැරමිටිය ?"

"මට මොකටද හැරමිටියක් ?" ආත්තම්මා පෙරළා ඇසුවා ය. ඈ මුක්කන් නාසය ඇති පුංචි යස්නොව් දෙස බලා මෙසේ ද කීවා ය :

"ඔයා සර්කසයෙන් වෙන්න ඕනෑ. ඇතුළට එන්න. අපි ඔයාව කන්නෙ නෑ."

කොටියා ද සිනා සෙන්නාක් මෙන් මුහුණ බොකුටු කර මෙසේ කීවේ ය :

"එන්න, අපි ඔයාව කන්නෙ නෑ."

ප්‍රාතිහාර්යයන් ඇත්තෙන් ම සිදු වන බව ද පිට සක්වළ සත්ත්වයන් ජීවත් වන බව ද තමාට දකින්න ලැබුණ දෙයින් ඒත්තු ගත් යස්නොව් ගෙට ඇතුළු වෙමින් මෙසේ කීවේ ය :

"ආයුබෝවන්. කොහොම ද ඔයාලගෙ සැප සනීප ?"

10

කොටියාගේ මුල් රහස

සර්කසයේ ප්‍රධාන සතුන් පුහුණු කරන්නා වූ සෙමියොන් යස්නොව් (ජ්‍යෙෂ්ඨ) සිය දියණිය අමතා මෙසේ කී ය :

''වීරා ඔයාට පිස්සු. අපි මේ ඉන්දියාවෙ සංචාරයක යෙදෙන්න ලැස්ති වෙනවා. ඔයා ඒකට පුහුණු නොකරපු සතෙක් ඇතුළත් කරන්න හදනවා.''

''ඔහු කලින් පුරුදු කරල තියනවා. මම ඔබට ස්ථිර ව කියනවා – ඔහු පුරුදු සතෙක්'' වීරා යස්නෝවා තරයේ කියා සිටියා ය.

''ඔහු ඉතා ම දක්ෂයෙක්'' කණිෂ්ඨ සෙමියොන් යස්නොව් සිය සොහොයුරියගේ කීම ස්ථිර කෙළේ ය. ''මම ඔහු ගැන සම්පූර්ණ වගකීම බාර ගන්නවා.''

''මේ නම් විශ්වාස කරන්න බැරි තරම් භූතවන්ත සතෙක්'' ආත්තම්මා සහතික වූවා ය. ''මම ඔහු මුළුමනින් ම රෙකමදරු කරනවා.''

''බෑ, බෑ'' යස්නොව් අවසාන වශයෙන් කියා කාමරයෙන් පිට වී ගියේ ය.

''මේ අවස්ථාවේ දී සියල්ල බිඳ වැටුණොත් ඒක හරි ම ලජ්ජාවක්'' ආත්තම්මා ජනේලය වෙතට යමින් කීවා ය. පහසුවෙන් ඇවිදින ඇතමා ලත් සුවය ගැන තව ම මවිතයෙන් සිටින්නී ය. ''මම කියන්න හිටියා කොටියා අපේ දෙස්තරලට වැඩිය වෙදකම් දන්න බව.''

''ඔයා එහෙම කීවොත් තාත්තා ගිලන් රියක් ගෙන්වාවි'' වීරා කීවා ය. ''අපේ තාත්තා පැරණි මතධාරියෙක්. එයා කොටින්ගේ රෝග සුව කිරීමේ බලය ගැන විශ්වාස කරන්නේ නෑ.''

"අපට (රෝග සුව කිරීමට) විදුලි බලය යොදන්න වෙන්න පුළුවනි" යුලියා අදහසක් ඉදිරිපත් කළ ය.

කණිෂ්ඨ යස්නොව් ඔළුව වැනුවේ ය. "නාත්තා තේරුම් ගනීවි. එයා ඕනම සතෙක් දුටු පමණින් අඳුන ගන්නවා. එයාට ඉවක් තියනවා. නැත් නම් හරි ජංජාලයක් වේවි. සර්කසයේ අවසානයත් එය වෙන්න පුළුවනි."

මේ සාකච්ඡාව පැවැත් වුණේ සර්කස් හෝටලයේ කාමරයක දී ය. දැන් සියල්ල සාර්ථක වන බවට ලකුණු ඇත. ආත්තම්මාගේ තොරතුරු හරි ය. යස්නොවිලා ඉන්දියා සංචාරයක යන්නට සැරසෙති. එලොවියන් අඳුනා ගත් පසු වීරා සහ කණිෂ්ඨ යස්නොව් ඔවුන්ගේ උද්යෝගිමත් උදව්කාරයෝ වී සිටිති. වාද විවාද සහ කේන්ති යෑම් සහිත පැයකින් පසු ට්‍රැන්ක්වේරි - ට්‍රැන්කෝවේරි පවා සාමාන්‍ය දක්ෂ පුහුණු කළ සතෙකු මෙන් සර්කස් කවයේ රහ දක්වන්නට එකඟ වී සිටී. දැන් මේ හදිසියේ පැන නැඟුණ ජ්‍යෙෂ්ඨ යස්නොව්ගේ විරුද්ධත්වය නො ඉවසිය හැකි බාධාව ය.

"කොටියාගේ රහ දැක්වීමක් ඇර මේ ගැන කරන්න වෙන කිසි දෙයක් නෑ. මේකට අපි පොඩි උපායක් යොදමු. මම අක්බාර් (සර්කසයේ කොටියා) නිදි කරවන්න යමක් දෙන්නම්."

"මොන විකාර කතාවක් ද ?" වීරා විරුද්ධ වුවා ය. එහෙත් එය එතරම් උද්‍යෝගී විරුද්ධ වීමක් නො වී ය.

"මොකද ? අද ම ද ?" ආත්තම්මා ඇසුවා ය.

"ඔව්, හෙට පරක්කු වැඩියි" වීරා උත්තර දුන්නා ය "අනිද්ද අපි නැව අල්ලා ගන්නට ඔදෙස්සාවට යනවා. අද තමයි අන්තිම අවස්ථාව තියෙන්නෙ. අපේ කොටියා බාර ගන්න නාත්තා කැමති කරවා ගන්නට."

"මම කියවා තියෙනවා මේ වගෙ දෙයක් නාට්‍ය ශිල්පියෙකුගේ ආත්ම චරිත කතාවක, දවසක් ප්‍රධාන ශිල්පියා අසනීප වුණා. ඉතින් නිෂ්පාදකයා ඇහුවා ඒ කොටස කාට හරි කරන්න පුළුවන් ද කියා අපේ වීරයා කීවා තමාට පුළුවන් බව. ඉතින් ඔහු එක රැයින් ම කීර්තිමත් වුණා" යුලියා කීවා ය.

"ඉතින් කොහොම ද පිඹුර ගෙනියන්නෙ ?" ආත්තම්මා ඇසුවා ය.

"මම එයත් එක්ක කතා කළා" වීරා කීවා ය. "එයා එකඟ වුණා ඉන්දියාවට ලොකු ලැලි පෙට්ටියක් තුළ යන්නට. බඩු පෙට්ටි අතර මුකුත් ප්‍රශ්නයක් ආවොත් මට කියන්න පුළුවන් ඔහුත් බඩුවල කොටසක් බව."

''එතකොට අපි කොටියා පිළිබඳ සැලැස්ම දැන්ම පටන් ගමිමු. කවුරු කවුරු මොන මොනව ද කරන්නෙ ?''

''මම බලා ගන්නම් අක්බාර් දඩසේ නිවාඩුව ගන්නා බවට'' කණිෂ්ඨ යස්නොව් කීවේ ය.

''මම සර්කසයෙන් කුඩුවකුයි වැන් රියකුයි ලබා දෙන්නම්'' වීරා කීවා ය.

''මම බාර ගන්නම් සර්කස් මැනේජර් එක්ක කතා කරන්න. කොල්යාට ඒ කාලෙ අපේ මැරිච්ච නංගිත් ජෝඩු කරල තිබුණා.''

'යුද්ධ මන්ත්‍රණ සභාව' අවසාන විය. එයට සහභාගි වූ අය විසිර ගියහ.

රහ දැක්වීමේ තිරය ඉහළ ගිය පසු සැලැස්ම ක්‍රියාවෙහි යොදවන ලදි. කණිෂ්ඨ යස්නොව් අක්බාර්ට නිදී බෙහෙත් වඩියක් දුන් නිසා උෆ මිනිසුන් සමඟ මොන ම ඇයි හොඳයියක් වත් ප්‍රතික්ෂේප කරමින් කුඩුව තුළ වැතිර ගත්තේ ය. වීරා කොටියා වැන් රියෙන් ගෙනාවා පමණක් නොව ඔහු රංගනයේ දී ක්‍රියා කළ යුතු ඇකාරය ගැන උපදෙස් සහිත කතාවක් වැන් රිය තුළ දී ඔහුට කිරීමට ද සමත් වූවා ය. ඔහු සමඟ වැන් රියෙහි ගමන් කළ යුලියා අන්තර් කාරකා පර්යේෂණ ගමනෙහි ඉරණම ඔහුගේ හැසිරීම මත රඳා පවත්නා බව ඔහුට මතක් කර දුන්නා ය. ආත්තම්මා වේලාපහින් සර්කසයට පැමිණ ආගන්තුකයන්ට අවශ්‍ය අමතර ධෛර්යය ලබා දීම සඳහා ප්‍රීති සෝෂා කිරීමට අධ්‍යක්ෂකගේ විශේෂ ආසන කුටියෙහි තැන්පත් වී සිටියා ය.

ජොෂ්ඨ යස්නොව් පමණක් මේවා ගැන කිසිවක් නොදැන සිටියේ ය. කණ්ඩායමේ ගමන් බලපත්‍ර ගැන සොයා බැලීමට ගිය නිසා ඔහු එන විට පමා විය. ඔහු පැමිණියේ රංගනය පටන් ගන්නට ඔන්න මෙන්න කියා තියෙද්දී ය. සිය දියණිය කෙරෙහි විශ්වාසය තබන්නට පුරුදු වී සිටි නිසා ඔහු මේ සම්බන්ධයෙන් අනියම් ලෙස මැදිහත් වූයේ ද නැත.

මෙසේ රංගනයෙහි දෙවන කොටස ඇරඹුණේ ය. තූර්ය වාදනය පටන් ගන්නා ලදි. සර්කස් කවය වට කරන ලද ලෝහමය වැට ධාරා ලෝකයෙන් දීප්තිමත් වූයේ ය ඈ විසින් සමාව දෙනු ලැබූ fපීමා සමඟ යුලියා දෙවෙනි ආසන පේළියේ වාඩි වී සිටියා ය.

නරඹන්නෝ ප්‍රීති සෝෂා කරන්නට වූහ.

කළු ඇඳුම් කට්ටලයකින් සැරසුණු ජොෂ්ඨ යස්නොව් ආලෝකමත් වූ කෙළි මඩලට සෙමෙන් පිය නැඟී ය. ඔහුගේ පයෙකින් දිලිසෙන ලෝහ පෙති (sequins) ඇල්ලූ ඇඳුමකින් සැරසුණ මුක්කන් නාසයක් සහිත වීරා යස්නොව් සිටියා ය.

කණිෂ්ඨ යස්නොව් ඔහුට නියමිත ස්ථානයෙහි සිටියේ ය. ඔහු සහ ඔහුගේ සහායකයෝ සතුන් රහ මඩලට එවූහ.

තූර්ය වාදනය නතර විය. නිහැඩියාව රජ කෙළේ ය. ආවරණය කළ මහ ඔස්සේ සිංහයෝ සතර දෙනෙක් ද, කළු අලුන් දිවියෙක් ද, මඳ වේලාවකට පසු කොටියෙක් ද, පැන පැන අඩි ගමනේ සර්කස් කවයට ආහ.

හදිසියේ ම සියලු සත්තු පරීක්ෂාකාරී වූහ. තමන් අතරේ අමුත්තෙකු සිටින බව ඔවුහු දැන ගත්හ. බියට පත් අලුන් දිවියා බිම වැතිර උගේ වල්ගය තදින් බිම ඝසන්නට විය.

ට්‍රැන්ක්වේරි – ට්‍රැන්කෝවේරි වීරාගේ උපදෙස් අනුව කල්පනාවෙන් සිට දිවියා දෙසට හැරී ඔහුගේ නියුණු දිග දළ පෙනෙන සේ විශාල හනු විදහා මහ හඬින් ගෙරවූ විට ඌ කීකරු බළල් පැටවෙකු මෙන් පාදම උඩට පැන ගත්තේ ය.

කොටියා ආචාර කරන විලාසයෙන් උගේ හිස වනා ජ්‍යෙෂ්ඨ යස්නොව් දෙස බැලුවේ ය. යස්නොව් ද කොටියා දෙස බැලුවේ ය. සතුන් හීලෑ කරන්නාගේ තොල් සැලෙන බව යුලියා හොඳින් ම දුටුවා ය. කිසියම් අමුත්තක් ගැන ඉවක් තිබුණ නමුත් කුමක් සිදු වන්නේ දැයි ඔහු හරි හැටි නො දැන සිටියේ ය.

කොටියා උගේ කට වැසුවේ ය. ආචාර කරන්නාක් මෙන් හිස කරුණික ලෙස උස් පහත් කෙළේ ය. හිස් පාදමක් වෙනට ගොස් වීරා දෙස ඕනෑකමින් බලමින් පාදම උඩට පැන ඒහි නිදා ගත්තේ ය.

"බොහොම් හොඳයි" තරුණ පුහුණු කරන්නියට ඇගේ සතුට උස් හඬින් නො පවසා සිටින්නට බැරි විය. ඈ නරඹන්නන් ඉදිරියෙහි සතුන් දක්වා සිටින්නට මෙන් අත් දෙපසට විහිදු සිටියා ය.

මහ හඬින් අත් පොළසන්. නපුරු මුහුණින් සිටි යස්නොව් පවා හිස නැමී ය. ඔහු සිය කාර්යෙහි නියුතු ව සිටියේ ය. ඵහ දැක්වීමට ඔහු අවහිරයක් නො කරන බව යුලියා තේරුම් ගත්තා ය. දැන් සියල්ල රඳා පවතින්නේ එලෝ වැසියා තමාගේ කොටස ඉටු කරන ආකාරය මත ය. ඈ අධ්‍යක්ෂකගේ කුටිය වෙත නෙත් යැවිවා ය. එහි හිස පැසුණු අධ්‍යක්ෂක ද ඔහුගේ පසෙකින් ආත්තම්මා ද හැඟීම් බර ව සිනා සෙමින් වාඩි වී සිටියහ.

වීරා ලොකු වළල්ලක් ගෙන ඔසවා ඇල්ලුවා ය. ජ්‍යෙෂ්ඨ යස්නොව්ට මේ කීර්තිය බලෙන් පැහැර ගන්නා වෙනින් ඇස් ඉවත් කර ගත නො හැකි විය. තමා රවටන ලද බව තේරුම් යාම නිසා ඔහු සිය දියණිය කෙරෙහි කෝපයෙන් සිටියේ ය. එහෙත් ඇත්ත වශයෙන් ඈ ගැන බියක් ද ඔහු

තුළ විය. අලුත් කොටියා පළපුරුදු, සන්සුන් සහ ඥානවන්ත එකෙකු බව තමාට ඔප්පු කිරීමට ඔවුන් හැම දෙනා සෑහෙන කාලයක් ගත කළත් වල් සතෙකු හැඹ විට ම වල් සතෙකු බවත් උෆ කවදා වත් සම්පූර්ණයෙන් විශ්වාස කිරීමට බැරි බවත් සෑම සතුන් පුනුණු කරන්නෙකු ම දන්නා කාරණයකි.

සත්තු එකෙකුට පසු තව එකෙක් බැගින් වළල්ල තුළින් පැන්නාහ.

අන්තිම පනින්නා ට්‍රැන්ක්වේරි – ට්‍රැන්කෝවේරි විය. ඔහු තමා හුන් පාදමෙන් ඉවතට පැන වළල්ල වෙනට ගොස් නැවතී හිස වැනුවේ ය. ඔහු මේ ව්‍යායාමයට කැමති නැති බව පැහැදිලි ය.

''අනේ, පනින්න – මම ඔබෙන් බැගෑපත් ව ඉල්ලා සිටිනවා'' වීරා කීවා ය.

සමහර මිනිසුන්ට මේ වචන ඇසුණෙන් ඔවුහු සිනා සෙන්නට වූහ.

කොටියා අකැමැත්තෙන් පැන්නේ ය. එහෙත් උගේ කකුල වළල්ලේ පටලැවී වළල්ල වීරා අතින් ඉවතට විසි වී ගියේ ය. නරඔන්නෝ කටින් හුස්ම ගනිමින් බලා ගෙන සිටියහ. කොටියා වට පිට බැලුවේ ය. සිදු වී ඇති දේ දුටු ඔහු හැම දෙනාගේ ම – යටත් පිරිසයින් සිංහයන්ගේ පවා විස්මයට හේතු වන පරිද්දෙන් හිස පහත් කර වළල්ල කටින් ගෙන වීරා අතට දුන්නේ ය.

නරඔන්නෝ සිය මුළු වැරෙන් අත් පොළසන් දුන්හ. ඔවුන් සිතුවේ මෙය ක්‍රීඩාවෙහි කොටසකැයි කියා ය.

යස්නොවිට මෙය විශ්වාස නො කළ හැකි දෙයක් විය. ඔහු මීට පෙර මෙවැන්නක් දැක නැත. සර්කසයේ අධ්‍යක්ෂක පවා අත් පොළසන් දෙන බව යුලියා දුටුවා ය.

දර්ශනය නිමාවට පත් වෙමින් තිබුණේ ය. එහෙත් මේ විශිෂ්ට කොටියා තව කුමක් කරනු ඇද්දැයි බලා ගැනීමට නරඔන්නෝ පමා වූහ. අනෙක් සතුන් තමන්ට ලැබිය යුතු අත් පොළසන් බාර ගැනීමට පැදම් මත ඩාඩි වී සිට ඉවත් ව ගියහ. ඉන් පසු කොටියා හදිසියෙන් ම තමාගේ පාදමෙන් මහා පිම්මක් පැන සියල්ලන් විස්මයට පත් කරමින් බොහෝ ඉහළ ගොස් ක්‍රීඩා කවය මධ්‍යයට පාත් විය. යස්නොවි පවා නැති ගත්තේ ය. එහෙත් කොටියා කාලය නාස්ති කෙළේ නැත. යළිත් වහා උඩ පැන, මේ වර ගුවන මැද දී අත නළලට තබා ආචාර කෙළේ ය. මීට පෙර කොටි සැල්යුට් කරනු කිසිවෙකු දැක නැත.

''හරියට හරි'' කණිෂ්ඨ යස්නොවි කෑ ගැසුවේ ය.

කොටියා ඊට පසු සිය ඉදිරි ගාත් දෙක ඔසවා ගෙන පුහුණු කළ බළලුන් කරන්නාක් මෙන් ක්‍රීඩා මංඩපය තුළ වටේට පෙරෙට්ටු කෙළේ ය. ඔහු ද ජ්‍යෙෂ්ඨ යස්නොව් පසු කර යද්දී ඔහුට ඉහි මැරුවේ ය, යස්නොව්ට ඉබේ ඉහි මැරුණේ ය. එහෙත් තමා එසේ කෙළේ මන්දැයි ඔහුට ම තේරුම් ගන්නට බැරි විය.

කොටියා වීරා වෙතට ගිය විට ඈ ඔහුට අතට අත දුන්නා ය. ඔවුන් වෙය වැන් රියේ දී කතා කර ගෙන ඇති බව යුලියා තේරුම් ගත්තා ය.

වීරා ඉදිරියට පැන කොටියාගේ පිටේ පා ඉහළට ඇති ව අත් දෙකෙන් සිට ගත්තා ය. කොටියා ඒ සැටියෙන් ම ඈ ක්‍රීඩා කවය වටේ ගෙන ගියේ ය. ඉන් පසු ඈ සිය අත්වලින් ම කොටියාගේ හිස වෙතට ගියා ය. එවිට ඔහු පස්සා ගාත්වලින් නැගී සිටියේ ය. දෙපයින් නැගී සිටි කොටියාගේ හිසේ අත්වලින් නැගී සිටි තරුණිය ද සහිත ව ඔවුහු ක්‍රීඩා කවය තුළ වටේට ගමන් කළහ.

කොටියා කතා කරන්නාක් මෙන් තොල් සොලවනු තමන් දුටු බව සෑම කෙනෙක් ම සිතූහ. එහෙත් ඔහු යමක් කීවත් එය හෙණ හඬ මෙන් නැඟ ආ ත්‍රිකි සෝභා මධ්‍යයෙහි ගිලී ගියේ ය.

11

ඉන්දියාවෙන් ලියුම්ක්

පාසැල නැවත පටන් ගත් දිනට පසු දින යුලියාට කණිෂ්ඨ යස්නොව්ගේ ලියුම් ලැබුණේ ය. ඈ එය කියවීමට පෙර ffමා වෙතට රැගෙන ගියා ය. අනාගත සිංහයින් හිලෑ කරන්නා මෙසේ ලියා එවා තිබුණේ ය :

"ආදරණීය යුලියා,

අපි කිසි බාධාවකින් තොර ව ඔදෙස්සාවලට ළඟා වීමු. අපේ නැව විශාල කදිම එකකි. පිඹුරාට පෙට්ටියක් තුළ යාම කරදරයක් වෙතැයි කොටියා අතිශයින් දුක් වුයේ ය. පිඹුරාට තුන් මාසයක් ආහාරයක් නොගෙන සතුටින් යා හැකි වුවත් මම ඔහු ගැන හොඳින් බලා ගත්තෙමි. එසේ වුවත් මම ඔවුන්ගේ හමුවීම් පිළියෙල කෙළෙමි. ඔවුහු තමන්ගේ ම බසින් විඳාත්මක කරුණු සාකච්ඡා කළහ. කිසිවෙක් ඔවුන් නොදකින බවට සහතික වන්නට වීරා පරෙස්සම් වෙයි. අක්බාර් කොටියා උගේ නින්දෙන් නැඟිට හුඟ දවසකි. ඒත් ඔහු සිය අම්මත්තා සමඟ කිසි ඇයි හොඳයියක් නැති ව තමාගේ පාඩුවේ සිටී. තාත්තා තව ම වීරා සහ මා කෙරෙහි විශ්වාසය තබන්නේ නැත. අප තවත් කපටිකම් කරතැයි ඔහු බලාපොරොත්තු වෙයි. එහෙත් අපට ඉන්දියාවට ළඟා වන තුරු ඔහු සමඟ කිසිවක් කියන්නට බැරි ය. අප තාත්තා සමඟ හැම දේ ම කියන්නට පුරුදු වී සිටි නිසා මෙය සතුටුදායක තත්ත්වයක් නොවේ. ට්‍රැන්කි තමාට රැහුම් දක්වන්නට බැරි යැයි හැම තිස්සේ ම අවලාද කියයි. තාත්තා සමඟ කතා බස් කර තමාට කොටියෙකුට මෙන් නොව ඵහාවාර්යවරයෙකුට මෙන් සලකන්ට පොලඹවා ගන්නට ඕනෑ බව ඔහු තරයේ කියා සිටී. ඕ හිතන්නේ ඔහු එයට ඉක්මන් නොවිය යුතු බව යි. නැව තව ටික වේලාවකින් පිටත් වෙන නිසා මේ වේලාවේ මට ටිකක් කලබල ය. ඔබේ ආත්තම්මාට මා වෙනුවෙන් සුබ පතන්න.

මේ ඔබේ හිතවත්,
සෙමියොන්."

"මට ඊයේ රෝසි හමු වුණා" fපීමා කීවේ ය. අපි අතුරුදන් වුණා ම කඳවුරේ මහ ගෝට්ටියක් ඇති වුණ බව ඔහු කීවා. ඔයාගෙ ආත්තම්මා රිපෝන් කරන තුරු ම එය පැවතුණා ලු. පසු ද දවස තිස්සේ ම ඔවුන් කොටි ගැන හැම තැන ම හෙව්වා ලු."

මාසයකට පසු ව ඊ ළඟ ලියුම ආවේ බොම්බායෙනි. ඔවුන් දිනපතා ම සර්කස් දර්ශන පවත්වන බවත්, දැන් හොඳින් හැසිරෙන 'ට්‍රැන්කි' රඟ දැක්වීමට පුරුදු වී ඇති බවත් එපමණක් නොව ඔහු ඉන් ශ්‍රීනියක් ලබන බවත් ලියුමේ සඳහන් විය.

ඔහු උපන් නළුවෙක් විය. ජොෂ්ඨ යස්නොව් කෙමෙන් ඔහුට පුරුදු විය. ඔවුන් මෙතෙක් ඇත් වී සිටීම ලජ්ජාවට කරුණකි. කණ්ඩායම එහිත් සංදර්ශන පැවැත්වීම සඳහා ඉක්මනින් ම මදුරාසියට යනවා ඇත.

තවත් දවස් දහයක් පසු විය. බලාපොරොත්තුවෙන් සිටීම දරා ගත නොහැකි දෙයක් විය. ආත්තම්මාට නිදා ගන්ට පවා නොහැකි විය. වාසනාවකට මෙන් මොස්කව්වලට ටැලිග්‍රෑමයක් යැවීමට වීරා යස්නෝවාට හොඳ සිහිය තිබුණේ ය.

"මිතුරන්ගෙන් වෙන් වුණා. සියල්ල සතුටුදායක යි. විස්තර කැපෑලෙන් — වීරා"

එදා සවස යුලියා ටැලිග්‍රෑමයත් අතේ ඇති ව fපීමා හමු වෙන්ට පිටමෙදිව්වා ය. යුලියා සහ තමන්ගේ පුතා මෙතරම් උනන්දුවෙන් සිටින්නේ මන්දැයි fපීමාගේ දෙමාපියන්ට තේරුම් ගත නොහැකි විය.

පණිවුඩ දෙකක් ඒ සමඟ ම ආවේ ය. පළමු වැන්න සෙමියොන්–ගෙනි.

"ආදරණීය යුලියා, මා මෙය ඔබට ලියන්නේ සියල්ල සිදු වූ ආකාරය කීමට ය. අපි මයිසෝරයට ඇවිත් ඒ නගරයේ ම හදුන්වන නගරයේ සර්කස් දර්ශනයක් පැවැත්වීමු. මෙය ඔබ දන්නා ස්වභාවික සත්ත්ව ආරක්ෂිත අඩවියට කිට්ටු ම තැන ය. එදා හැන්දෑවේ ට්‍රැන්කි ඒ නගරයේ මිනිසුන්ට කවදා වත් අමතක නොවන රඟපෑමක් දැක්වූයේ ය. එය අපට පවා අමතක නොවන්නකි. දර්ශනයෙන් පසු අපි අපේ මිත්‍රයන් මුදා හැරියෙමු. ඔවුන් එළි වෙන්ට පෙර ආරක්ෂා සහිත ස්ථානයකට යාම සඳහා ඉක්මනින් කැළෑවට වැදුණාහ. අප ආයුබෝවන් කී විට කොටියා හැඩුවේ ය. ඔබට සුබ පතන්නැයි ඔහු මගෙන් ඕනෑකමින් ඉල්ලා සිටියේ ය. අපි ඊට පසු හමු නොවීමු. නාත්තාගේ චිත්ත ධෛර්යය සම්පූර්ණයෙන් බිඳ වැටුණේ ය. එහෙත් අපි මුළු කතාව ඔහුට කීවෙමු. ඔහු එය විශ්වාස කළා ද නැද්දැයි මම නොදනිමි. එහෙත් ඔහු කොටියෙකු නැති වුණු බවට ප්‍රකාශයක් නිකුත් කෙළේ ය. ඔහු වෙන මොනවා කරන්න ද? දිනක් අපට කොටි

දෙන්නෙකු සිටි නමුත් පසු ද එකෙකි. ඇත්තෙන් ම ඔබ හොඳින් දන්නවා ඔහු ආපසු නො ආ බව, තමන්ගේ සැප සනීප දන්වන බවට ඔවුහු අපට පොරොන්දු වූහ. ඒත් කොහොමෙ දැයි කිවේ නෑ. අපි බලාපොරොත්තු ව සිටිය යුතු යි. අපි ඉක්මනින් ආපසු එන්නෙමු විරා හරි දුකෙන් සිටී.

සෙම්යොන්."

දෙවෙනි පණිවුඩය ද එදින ම ලැබුණේ ය.

තැපැල්කාරයා දෙරේ සීනුව හැඩවී ය. එවන්නාගේ ලිපිනය නැති ලියාපදිංචි කළ පාර්සලයක් අත්සන් කර බාර ගන්නා ලෙස ඔහු ඉල්ලා සිටියේ ය. පාර්සලය විවෘත කළ විට ඒ ඇතුළේ කොටියාගේ සහ පිඹුරාගේ ඡායාරූප තිබුණේ ය ඒවායේ පිට පැත්තේ පිළිගැන්වුම් පාඨ ලියා තිබුණේ ය. එකක මේ පාඨය විය: "අපේ ආදරණීය යුලියාට – ආසිරි පෙරටුව – ඇගේ කරදරකාරී අමුත්තන්ගෙන්." තව එකක මෙසේ විය; "අපේ ආදරණීය fපීමාට... " තුන් වැන්නක තිබුණේ "අපේ ආදරණීය මාරියා මිඛායිලොව්නාට... " ආදි වශයෙනි. මුළු යස්නොව් පවුලට ඡායාරූප ද තවත් වැඩිපුර ආත්තම්මාගේ කකුලේ ගැමට ආලේප ටියුබයක් ද ඒ තුළ විය.

තමාට අවශ්‍ය ඕනෑ ම දෙයක් ටැලිfපෝනය පාවිච්චි කිරීමෙන් සොයා ගන්නට දන්නා ආත්තම්මා පාර්සලයේ මුද්දරවලට වැදී තිබුණ මුද්‍රාවේ පිහිටෙන් පාර්සලය එවූ තැපැල් කන්තෝරුවේ අංකය සොයා ගත්තා ය. එය කොස්ට්‍රෝමා පළාතේ ගම්බද කුඩා තැපැල් හලකි. ආත්තම්මා එයට අමතා පාර්සලය එවීමට කවදැයි විමසුවා ය. ගැහැනියක් කතා කර පුදුම කතන්දරයක් කීවා ය. එදා රෑ උල්කාපාතයක් ගමට උඩින් ගමන් කරද්දී කිසිවෙක් පාර්සලය තැපැල් කන්තෝරුවේ එළිපත මත තබා ඒ මත රුබල් පහේ නෝට්ටුවක් ද ඒ මත ගලක් ද තබා ගොස් තිබුණේ ය. තැපැල් කාර්යාලයේ අය අවශ්‍ය මුද්දර පාර්සලයේ අලවා එහි ලිපිනයෙහි සඳහන් පරිදි මොස්කව්වලට තැපැල් කළහ. එයින් රුබල් තුනකට වඩා මාරුකාසි ඉතිරි ව තිබුණේ ය. මේ ඉතිරි මුදල්වලට කළ යුත්තේ කුමක් දැයි දැන ගැනීමට තැපැල් කන්තෝරුවේ මිනිසුන්ට අවශ්‍ය ව තිබුණේ ය.

ආත්තම්මා මුදල්වලට කළ යුතු දේ ගැන ඔවුන්ට කිසිවක් නො කීවා ය. එහෙත් ඒ වෙනුවට ගම උඩින් ගියේ මොන විධියේ උල්කාපාතයක් දැයි ඇසුවා ය. ඉතා දීප්තිමත් එකකැ යි ගැහැනිය පිළිතුරු දුන්නා ය. එය ගමට ඉහළින් වටුම් ගැසීම පවා කෙළේ ය. එහෙත් එය දුටුවේ රාත්‍රියේ ය. දැක ඇත්තේ ද එක තැනැත්තෙකු විසින් පමණකි. ආත්තම්මා තැපැල් මහත්මියට ස්තුති කර රිසීවරය තිබ්බා ය.

යුලියා ඇගේ මිතුරන්ගේ පින්තූර රාමු කර තමාගේ ඇඳට උඩින් එල්ලුවා ය. ආත්තම්මා ඇගේ ජායාරූප ඇල්බමයක දැමුවා ය. පිමා අද දක්වා ඔහුගේ පින්තූර තැනින් තැන ගෙන යයි. ඒවා භයානක ලෙසට තැළී පොඩි වී යාමට ඉඩ තිබේ.

කවද නමුත් අමුත්තන් වඩා සම්මත ආකාරයකින් ආපසු එතැයි සියල්ලෝ විශ්වාස කරති. සමහර විට බළලෙක් සහ ඔටුවෙක් ලෙසින් ?

කාට කියන්න පුළුවන් ද ?

නිමි

කීර්තිමත් විද්‍යා නිබන්ධ ලේඛක
ආතර් සී. ක්ලාක් ශූරීන් වේන
'අගාධයට ඉහලින්' කෘතිය
සිළිගැන්වූ අවස්ථාව

92 : 06 : 27

464, හෑගිලෙවල් පාර, ගංගොඩවිල - නුගේගොඩ